

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

லலித் அத்துலத்முதலி மஹபொல உயர்கல்வி புலமைப்பிரிசில் நம்பிக்கை நிதியம்

Lalith Athulathmudali Mahapola Higher Education Scholarship Trust Fund

2022

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS



Ministry of Trade, Commerce and Food Security

2022

වාර්ෂික වාර්තාව හා ගිණුම්

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන
ශීෂ්‍යත්ව භාර අරමුදල

පටුන

අරමුදල් අරමුණු හා පරමාර්ථ	1
මූලික වටිනාකම්	2
පසුගිය වර්ෂ 05 තුළ ලබාගත් ජයග්‍රහණ	3
1981 සිය 2022 දක්වා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල හාර අමාත්‍යාංශය හා විෂය හාර අමාත්‍යවරයා	4
භාරකාර මණ්ඩලය - 2022	5
අධ්‍යක්ෂවරයාගේ වාර්තාව	6 - 8
මෙහෙයුම් සමාලෝචනය	9 - 16
ආයතනික යහපාලනය	17 - 19
මහපොළ හාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන	20 - 25
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ව්‍යාපෘති	26
මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති වාර්තාව	27 - 33
විගණන පිළිතුරු	34 - 48
මූල්‍ය ප්‍රකාශන	49 - 76

දැක්ම (Vision)

දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම.

ඉලක්ක (Mission)

වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

මෙහෙවර (Objectives)

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ද්විතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික
  අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.
- තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහායවීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පාසල් සහ ආයතන ආදිය පිහිටුවීම හා ඒවාට ආධාර සැලසීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පුද්ගලයින්ගේ නිපුණතා නංවාලීම සහ වර්ධනය කිරීම සඳහා ආධාර සැපයීම. (දැනට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබාදීම මූලික හා ප්‍රමුඛ කාර්යය ලෙස සලකා ක්‍රියා කර ඇත.)

මූලික වටිනාකම්

සුපිලිපන්බව (Integrity)

අප විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා තෝරා ගන්නා ලද සිසුන් නියමිත ක්‍රමවේදයක් යටතේ ඉතා විනිවිද භාවයකින් යුක්තව සාධාරණව සිදු කරන අතර සුදුසුකම් ලබන සිසුන්ගේ ගෙවීම් ඉතා සාධාරණ කාලයක් තුළ ඔවුන්ට ලබාදීමට නිතරම උත්සුක වේ.

නම්‍යතාවය (Flexibility)

අරමුදලේ සේවයකයින් හා අධ්‍යක්ෂ අතුලු භාරකාර මණ්ඩලය අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව අදහස් සොයා යමින් තරඟකාරී මූල්‍ය වෙළඳපළ තුල ඉතා සාර්ථකව කටයුතු කරයි.

සුභවාදී ආකල්ප (Positive Attitudes)

ශිෂ්‍යත්ව ලබාදීමේදී හා අනෙකුත් ආයතන සමඟ හා විශ්ව විද්‍යාල සමඟ කටයුතු කිරීමේදී හා අරමුදල් සපයා ගැනීමේදී ඉතා විශාල අභියෝග රාශියකට මුහුණදීමට සිදුවන අතර එම සියලුම අභියෝග ඉතා සුභවාදීව ජය ගැනීමට මනා එළඹුමක් සේවකයන් තුළ පවතී.

කණ්ඩායම් හැඟීම (Team Spirit)

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි දක්වන ලෙන්ගතු බව සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරා ගැනීමෙහිලා එක්ව කටයුතු කරති.

ප්‍රතිඵලදායක බව (Effectiveness)

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සේවකයින් තුළ මනා අවබෝධයක් හා විශ්වාසනීයත්වයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීමට නිතරම උක්සුක වේ. ඉතා කුඩා සේවක සංඛ්‍යාවක් (සේවකයන් 10 ක්) තුළින් මාසිකව ශිෂ්‍යත්ව 70,000 ක් පමණ ගෙවීම් සිදු කරනු ලබයි.

විශිෂ්ඨත්වය කෙරෙහි නැඹුරුව (Tendency towards uniqueness)

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ සේවකයින් අඛණ්ඩව සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

පසුගිය වර්ෂ 05 තුළ (2017 -2022) ලබාගත් ජයග්‍රහණ

- ශිෂ්‍යත්ව වාරිකයක වටිනාකම රු.2,150/- සිට රු.2,500/- දක්වා වැඩි කිරීම. (භාණ්ඩාගාර දායකත්වය රු.350/- සිට රු.2,450/- දක්වා වැඩි කරන ලදී.)

- 2018 වර්ෂයේ දී මහපොළ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලැබීමේ ආදායම් සීමාව රු.ලක්ෂ 03 සිට රු.ලක්ෂ 05 දක්වා වැඩි කල අතර එහි ප්‍රතිඵලයක් ලෙස අතිරේක ශිෂ්‍යත්ව සංඛ්‍යාව 4,000 කින් පමණ වැඩි විය.

- 2019 වර්ෂයේ දී ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා සෘජු බැංකු ක්‍රමය හඳුන්වා දෙන ලදී. සෘජු ගෙවීම් ක්‍රමය යටතේ සිසුන්ගේ ගිණුම්වලට මාසික ශිෂ්‍යත්ව වාරිකය සෘජුවම බැර කරනු ලැබේ.

- සියලුම උසස් තාක්ෂණ ආයතනවල සිසුන් සඳහා ශිෂ්‍යත්ව වාරික මුදල රු.1,500/- සිට රු. 2,500/- දක්වා රු.1000/- කින් ඉහළ නංවන ලදී.

- 2021 වර්ෂයේ අභියෝග හමුවේ වුවද වාර්ෂිකව ලබාදෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 1,000 කින් ඉහළ නැංවීමට හැකියාව ලැබුණි. ඒ අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයේ (2022) සිසුන් 16,000 කට ශිෂ්‍යත්ව පිරිනැමීමට කටයුතු යොදා ඇත.

- 2022 වර්ෂයේ මුල්‍ය වෙළෙඳපලේ අස්ථායි තත්ත්වය යටතේ වුවද ක්‍රමවත් මූල්‍ය කළමනාකරණය තුළින් හා වියදම් පාලනය කිරීම තුළින් 12% ක ශුද්ධ වාර්ෂික වර්ධනයක් ලභාකර ගැනීමට හැකිවිය.

- මහපොළ අරමුදලේ ප්‍රාග්ධන වත්කම් ඉහළ නංවමින් ඉදිරි 05 වසර තුළ දැනට ලබාදෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 50% කින් පමණ ඉහළ නැංවීම සිදුකල යුතු බැවින් අරමුදලේ වාර්ෂික ආදායම රු.බිලියන 2 කින් පමණ වැඩිකල යුතුව ඇත. ඒ සඳහා හිටපු මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගේ පරිත්‍යාග වැඩ සටහන මගින් මාර්ගගත ලොතරැයිය සහ හරිත විශ්ව විද්‍යාල ගම්මාන ව්‍යාපෘතිය ඇතුළුව ප්‍රධාන ව්‍යාපෘති 03 ක් දියත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2021 වර්ෂයේ දී සිදුකිරීමට හැකියාව ලැබුණි. ඒ තුළින් 2025 වර්ෂය වනවිට අරමුදලේ ප්‍රාග්ධන වත්කම් රු.බිලියන 25 ක් දක්වා වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

1981 සිට 2022 දක්වා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා

	විෂය භාර අමාත්‍යාංශය	විෂය භාර අමාත්‍යවරයා	කාලය (වර්ෂය)
1	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා	1981 - 1983
2	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (ජාතික ආරක්ෂක අමාත්‍ය)	1984 - 1988
3	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1989-1990
4	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සුර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1991 -1992
5	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සුර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1993
6	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සුර් අමාත්‍යතුමා	1994
7	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු කිංස්ලි ටී වික්‍රමරත්න අමාත්‍යතුමා	1995 - 2000
8	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ, නාවික සංවර්ධන හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2001
9	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු රවි කරුණානායක අමාත්‍යතුමා	2002 - 2004
10	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමා	2004 මැයි - 2007
11	වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය	ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2008 - 2009
12	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා	2010 - 2012
13	ජනාධිපති ලේකම් කාර්යාලය	ජනාධිපති ලේකම්	2013 - 2014
14	ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය	ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා	2015
15	සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා	2015 නොවැ. - 2018
16	උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා	2018 ජූලි
17	නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2018 ඔක් - 2019 නොවැ.
18	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2019 නොවැ.
19	වෙළෙඳ අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2020 ජනවාරි සිට 2021දෙසැම්බර්
20	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	ගරු නලින් ප්‍රනාන්දු අමාත්‍යතුමා	2022 ජනවාරි සිට මේ දක්වා

භාරකාර මණ්ඩලය - 2022

	භාරකරුභාරකරුවන්/	නිලය	තනතුර
1.	ගරු ජයන්ත ජයසූරිය මහතා (රැස්වීම්වල මුලසුන දරන නොලදී)	අග්‍රවිනිශ්චයකාරතුමා	සභාපති
2.	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා (2021- 2022 මැයි)	වෙළෙඳ අමාත්‍ය	අමාත්‍ය භාරකරු
3.	ගරු නලින් ප්‍රනාන්දු මහතා	වෙළෙඳවාණිජ හා ආහාර , සුරක්ෂිතතා අමාත්‍ය	අමාත්‍ය භාරකරු
4.	ජේ.නි ජයවර්ධන මහත්මියහද්‍රා.එම්. (2021 – 2022 මැයි)	ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය	නිල භාරකරු
5.	එස්.ටී.කොඩිකාර මහතා (2022 ජූනි - 2022 දෙසැම්බර්)	ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය	නිල භාරකරු
6.	මහාචාර්ය කපිල පෙරේරා මහතා (2021 -2022 මැයි)	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	නිල භාරකරු
7.	එම්.එන්.රණසිංහ මහතා (2022 ජූනි සිට 2022 දෙසැම්බර්)	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	නිල භාරකරු
8.	කේසරලාල් ගුණසේකර මහතා	පත්කල භාරකරු	පත්කල භාරකරු
9.	ආචාර්ය රවින්ද්‍රනාත් ලියනගේ මහතා (2021 – 2022 ජූලි)	පත්කල භාරකරු	පත්කල භාරකරු
10.	වයි. මදුරප්පෙරුම මහතා (2022 අගෝස්තු - 2022 දෙසැම්බර්)	පත්කල භාරකරු	පත්කල භාරකරු

අධ්‍යක්ෂක වාර්තාව



2022 වර්ෂයේ රටේ පැවති ආර්ථිකයේ සමස්ත පසුබෑම් හමුවේ වෙළෙඳ පොල පොලී අනුපාත ඉතා සීඝ්‍ර ලෙස ඉහල ගිය අතර එහි වාසිය අරමුදල විසින් ලබා ගත් අතර සියලුම ආයෝජන, ආයෝජන කමිටුවේ නිර්දේශ මත මහා බැංකු බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් වල ආයේජන කරමින් වර්ෂය තුල රු.බි.1ක පමණ අතිරේක පොළි ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබුණි. මහපොළ භාරකාර මණ්ඩල අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ වියදම් කළමනාකරණයද උපරිම මට්ටමේ සිදු කොට වර්ෂය තුල රු.බි.1.7ක පමණ අතිරික්තයක් වාර්තා කිරීමට හැකියාව ලැබුණි. එමඟින් මහපොල අරමුදලේ සමස්ත 12% වර්ධනයක් ලගා කර ගැනීමට ඒ තුලින් හැකියාව ලැබුණි.

ශිෂ්‍යත්ව ගෙවීම්

2022 වර්ෂය තුලද සිසුන් වෙත අඛණ්ඩව ශිෂ්‍යත්ව වාරික ගෙවීමට හැකියාව ලැබුණු අතර භාණ්ඩාගාර අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2022 නොවැම්බර් හා දෙසැම්බර් මාස වල වාරික ගෙවීම තරමක් ප්‍රමාද විය. කෙසේ වෙතත් අරමුදලේ ප්‍රතිපාදන අත්තිකාරම් වශයෙන් ලබා දී සිසුන්ගේ ගිණුම් වෙත මුදල් නිදහස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාල ශිෂ්‍යත්ව තේරීම් කටයුතු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන අතර පැවති තත්වයන් යටතේ යම් ප්‍රමාදයක් සිදු වී තිබුණි. කෙසේ වෙතත් එම තේරීම් කටයුතු අවසන් කොට මහපොළ අරමුදල වෙත ලබා දුන් පසු ඉතා කෙටිකාලයක් තුල සිසුන්ගේ ගිණුම් වෙත ශිෂ්‍යත්ව වාරික මුදල් බැර කිරීමට බලාපොරොත්තු වේ.

අරමුදල වර්ධනය සඳහා වන නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2022 වර්ෂය පුරා පැවති අයහපත් ආර්ථික තත්වයන් තුල මහපොළ අරමුදලේ අරමුදල් යොදවා නව ව්‍යාපෘති ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම සුදුසු නොවන බව හා අරමුදල සතු වත්කම් සුරක්ෂිත කිරීම උදෙසා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ආරම්භ කිරීමට යෝජිත සියලුම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටවූ අතර අරමුදලට වැය බරක් නොවන හා ආදායම් උත්පාදනය කල හැකි පහත හඳුනාගත් ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට මහපොළ භාරකාර මණ්ඩලය තීරණය කරන ලදි.

01. මහපොළ මංගත ලොතරැයිය (Online lottery) ක්‍රියාත්මක කිරීම.
02. මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගෙන් පරිත්‍යාග ලබා ගැනීමේ වැඩසටහන.
03. මහපොළ අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්නය නැවත ආරම්භ කිරීම.
04. මහපොළ අරමුදලට අයත් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ වාර්ෂික ලාභයෙන් ප්‍රතිශතයක් මහපොළ අරමුදලට ලබා ගැනීම.

දැනට මහා භාණ්ඩාගාරය මුහුණ පා ඇති අරමුදල් නිදහස් කිරීමේ ගැටලුව හේතුවෙන් 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වාර්ෂික ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා අවශ්‍ය වන රු.බි. 1.5 ප්‍රතිපාදන වලින් රු.මි. 400ක් පමණක් අනුමත කොට ඇති අතර ඉතිරි රු.බි. 1.5 මහපොළ අරමුදලේ සංචිත වලින් යොදා ගැනීමට යෝජනා කොට ඇත. උක්ත ව්‍යාපෘති ක්‍රියාත්මක් කිරීම තුලින් කෙටිකාලීනව එයින් කොටසක් පියවා ගත හැකි අතර දීර්ඝකාලීනව අරමුදල වර්ධනය කිරීම සඳහා නව ව්‍යාපෘති ආරම්භ කල යුතු වේ.

ආයතනික යහපාලනය

2022 වර්ෂය තුලද නියමිත පරිදි භාරකාර මණ්ඩල රැස්වීම් පවත්වා ඇති අතර යටත් පිරිසෙයින් මාස 02ට වරක් රැස්වීමක් පවත්වා ඇත. අරමුදල සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන ඇති අතර විධිමත් ලෙස අභ්‍යන්තර විගණන කටයුතු ද සිදු කොට 2022 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අරමුදලේ ක්‍රියාකාරිත්වය හා ආයෝජන සම්බන්ධව හා වත්කම් සුරක්ෂිතතාවය සම්බන්ධව පසු විපරම් කිරීම හා අවශ්‍ය තිරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි. මේ සඳහා වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා හා අනිකුත් නිළධාරීන් ඉතා හොඳ සහයෝගයක් ලබා දුන් බව කෘතවේදීව සඳහන් කරමි.

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත පරිදි රජයේ විගණනය වෙත ඉදිරිපත් කිරීම 2023 පෙබරවාරි 28 දිනට ප්‍රථම සිදු කල අතර පිළිගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා ප්‍රමිතිවලට අනුව ගිණුම් පිළියෙල කිරීම හා වර්ෂය තුල ඉදිරිපත් කරන ලද සියලුම විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබාදීම සිදුකරන ලදි. තවද, ආයෝජන කමිටු රැස්වීම්ද පවත්වා ඇති අතර සියලුම ආයෝජන, ආයෝජන කමිටුව විසින් අනුමත කොට ඇත.

වත්කම් සුරක්ෂිත කිරීම

මහපොළ අරමුදල සතු වත්කම් සුරක්ෂිත කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා 2022 වර්ෂය තුල පහත ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබුණි.

01. මහපොළ අරමුදලේ සියලුම ආයෝජන, ආයෝජන කමිටු නිර්දේශ මත පමණක් සිදු කිරීම හා රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැදුම්කර වල පමණක් ආයෝජනය කිරීම තුලින් ඉහළ ප්‍රතිලාභයක් සමඟ වත්කම් සුරක්ෂිතතාවය ආරක්ෂා කොට ඇත.

02. මහපොළ අරමුදල විසින් නව ව්‍යාපෘති සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් 99 අවුරුදු බදු පදනම යටතේ හොරණ මිල්ලෑව වත්තෙන් ලබා ගත් අක්කර 123ක භූමිය අත්පත් කර ගැනිමේ කටයුතු සිදු කල අතර කායික භුක්තිය ලබා ගැනිමට අදාල ඉඩම් මැනිමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරියෙන් සිදු කරන බැවින් එහි යම් ප්‍රමාදයක් සිදු වී ඇත. 2023 වර්ෂයේ ජුනි මස වන විට ඉඩම අත්පත් කර ගැනිමේ කටයුතු අවසන් කල හැකිවේ.

03. අරමුදලට අයත් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ කටයුතු විධිමත් කිරීමට අදාල භාරකාර මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2023 වර්ෂය තුලදී එය අවසන් කොට එහි පරිපාලන කටයුතු විධිමත් කිරීමට හැකි වෙතැයි බලාපොරොත්තු වන අතර 2023 වර්ෂයේ අවසන් වීමට පෙර එම වත්කම් පිළිබඳව සුරක්ෂිතතාවය හා ආදායම් ලබා ගැනිමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අවසාන වශයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ශක්තිමත් කිරීමටත් එහි යහපාලනය හා ක්‍රියාකාරිත්වය තුලින් ස්ථාපිත අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් සහයෝගය දැක්වූ ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් පත් වූ සියලුම විෂය භාර අමාත්‍යවරුන් නිළ භාරකරුවන්, නිලධාරීන් හා ඉතා කැප වීමෙන් වැඩ කල සේවක මණ්ඩලයට, වෙළෙඳ අමාත්‍යාංශයේ හා අනිකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතන වල නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පල කර සිටිමි.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට එලඹෙන 2023 වර්ෂය ඉතා අභියෝගාත්මක වර්ෂයක් බවත් එය කළමනාකරණය කර ගනිමින් උසස් අධ්‍යාපන අපේක්ෂාවෙන්

සිටින අඩු පහසුකම් සහිත යෞවනයන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හා ශක්තිමත් කිරීමට පවතින අභියෝග ජය ගනිමින් අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබා දීමට හැකි වන ඉතා විශිෂ්ට ආයතනයක් බවට ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පත්වේවා යැයි මම එක සිතින් ප්‍රාර්ථනා කරමි.

එම්. පරාක්‍රම බණ්ඩාර,
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී,
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

මෙහෙයුම් සමාලෝචනය

ශිෂ්‍යත්ව ගෙවීම්

ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (වාරිකයකට ගෙවනු ලබන මුදල)

ශිෂ්‍යත්ව වර්ගය	ශිෂ්‍යත්වයක් සඳහා ගෙවනු ලබන මුදල (රු.)	මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.)	භාණ්ඩාගාරයේ දායකත්වය (රු.)
සාමාන්‍ය ශිෂ්‍යත්ව ගෙවීම්	5,000/-	2,550/-	2,450/-
කුසලතා පදනම මත ශිෂ්‍යත්ව ගෙවීම්	5,050/-	2,600/-	2,450/-

ශිෂ්‍යත්ව ප්‍රදාන මහපොළ භාර අරමුදල් දායකත්ව

සිසුන් ඇතුළත් කරගැනීම	ශිෂ්‍ය සංඛ්‍යාව
විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් (සියලු ගිණුම් වර්ෂවල))	63,001
තාක්ෂණික විද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන ශිෂ්‍යයන්	7,500
ශිෂ්‍යත්ව ගෙවීම සඳහා වාර්ෂික පිරිවැය	**රු. බිලියන 1.8**

මහා භාණ්ඩාගාරයේ දායකත්වය

ශිෂ්‍යයන් සංඛ්‍යාව (සියලු ගිණුම් වර්ෂවල)	63,000
වාරිකයක වටිනාකම (රු.)	2,450.00
වර්ෂයකට වාරික සංඛ්‍යාව	10
භාණ්ඩාගාර දායකත්වයේ වාර්ෂික වටිනාකම (රු.)	63,000 2,450 x 10
	1,543,500,000

මෙහෙයුම් සමාලෝචනය

මහපොළ ශිෂ්‍යත්ව සඳහා තොරා ගැනීම

අනු අංකය	පාඨමාලාව	තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			
			නව	පැරණි	එකතුව
	ජීව විද්‍යා	M	279	106	
		O	2,511	958	3,854
	භෞතික විද්‍යා	M	268	39	
		O	2,409	346	3,062
	වාණිජ	M	281	16	
		O	2,531	141	2,969
	කලා/වාණිජ	M	425	41	
		O	3,800	373	4,661
	ඉංජිනේරු තාක්ෂණය	M	78	6	
		O	705	54	843
	පෙවපද්ධති තාක්ෂණය	M	55	6	611
		O	499	51	
	එකතුව		**13,863**	**2,137**	**16,000**

මෙහෙයුම් සමාලෝචනය

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (අනෙකුත් ආයතන)


	ආයතනය	සිසුන් සංඛ්‍යාව
1.	ශ්‍රී ලංකා නීති විද්‍යාලය	25
2.	ජාතික තාක්ෂණ ආයතනය,මොරටුව	170
3.	බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය	26
4.	බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය	20
5.	ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා 14)	10
6.	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	1,500
7.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	400
	එකතුව	**2,151**

විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යකඳ සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යකඳලාභීන් අතර සැසඳීම

වර්ෂය	17/18	18/19	19/20	20/21	21/22
විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	30,000	31,158	34,161	35,000	40,111
ආදායම් සීමාව (රු.ලක්ෂ 5 ට අඩු) අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	15,000	20,000	17,890	20,000	26,000
මහපොළ ශිෂ්‍යකඳලාභීන් සංඛ්‍යාව	14,500	14,984	15,001	15,000	16,000
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	50%	64.1%	52%	57.1%	64.88%
මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	48%	48.%	44%	42.85%	39.88%
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන්	96%	75%	84%	75%	61.5%


2022.12.31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය තත්වය

සමස්ථ අරමුදල් කළඹ



	රු. මි.
භා/බැඳුම්කර	6,209
භා/බිල්පත්	5,336
ණයකර	375
වෙනත්	1
ස්.තැ.	500
එකතුව	**12,421**


ප්‍රධාන අරමුදල




	රු. මිලියන
ප්‍රධාන අරමුදල	12,421
NWSL ආයෝජනය	985
SLIIT ආයෝජනය	12
මිල්ලෑව ඉඩම	340
ජා.ලො.ම.ආයෝනය	2
එකතුව	**13,760**

මෙහෙයුම් සමාලෝචනය

ආයෝජන ආදායම - ප්‍රධාන අරමුදල



මුළු ආදායම 2022



මෙහෙයුම් සමාලෝචනය

මෙහෙයුම් සමාලෝචනය - 2022

ආයෝජන ආදායම් කාණ්ඩය	31.12.2022	31.12.2021	විචලනය
භාණ්ඩාගාර බැඳුම්කර - (කූපනය)	726.7	676.6	7%
භාණ්ඩාගාර බිල්පත් - පොලී	628.9	-	100%
ණයකර පොලී	110.8	161.2	-31%
රඳවාගැනීම් බද්ද නොමැතිව ස්ථාවර තැන්පතු පොලිය	272.1	309.7	-12%
වෙනත් ආදායම්	33.2	9.7	242%
මූළු ආයෝජන ආදායම	**1,771.7**	**1,157.2**	**53%**
සෘජු වියදම්			
භාරකාර ගාස්තු - ලංකා බැංකු ආයෝජන ගිණුම	(2.7)	(2.6)	4%
ශුද්ධ ආයෝජන ආදායම්	**1,769.0**	**1,154.6**	**53%**
වෙනත් ආදායම්			
ජා.ලො.ම. ලාභාංශ	1,381.8	1,230.0	12%
SLIIT කුලිය	25.0	25.0	0%
මූළු වෙනත් ආදායම්	**1,406.8**	**1,255.0**	**12%**
මූළු ආදායම	**3,175.8**	**2,409.6**	**32%**
වියදම්			
ශිෂ්‍යත්ව ගෙවීම්	(1,366.5)	(1,052.9)	30%
වැටුප් හා වේතන	(16.9)	(15.8)	7%
ක්ෂය වෙන් කිරීම්	(31.0)	(31.3)	-1%
වෙනත් පරිපාලන වියදම්	(15.3)	(17.4)	-12%
මූළු වියදම්	**(1,429.7)**	**(1,117.4)**	**28%**
වියදම් ඉක්මවූ ශුද්ධ ආදායම	**1,746.1**	**1,292.2**	**35%**

මෙහෙයුම් සමාලෝචනය

2022/23 අයවැය සමාලෝචනය

විස්තරය	ඇස්තමේන්තු හා අනුමත අයවැය	තථ්‍ය පිරිවැය (උපචිත පදනම)	විචල්‍යය	
	31.12.2022	31.12.2022	Rs.	%
ආදායම				
ප්‍රධාන අරමුදලේ පොලී ආදායම	1,100.0	1,771.8	671.8	61.07%
ජා.ලොෙ.ම. ලාභාංශ	1,300.0	1,381.8	81.8	6.29%
SLIIT කුලිය	25.0	25.0	-	0.00%
මුළු ආදායම	**2,425.0**	**3,178.6**	**753.6**	**31.08%**
වියදම්				
පුනරාවර්තන	**1,765.5**	**1,401.0**	**(364.5)**	**-20.65%**
ශිෂ්‍යත්ව ගෙවීම්	1,725.6	1,366.5	(359.1)	-20.81%
පුද්ගල පඩිනඩි	18.7	17.2	(1.5)	-8.07%
නඩත්තු වියදම්	2.8	4.0	1.2	42.86%
පරිපාලන වියදම්	14.3	10.6	(3.7)	-25.87%
වෙනත් පුනරාවර්තන වියදම්	4.1	2.7	(1.4)	-34.15%
ප්‍රාග්ධන වියදම්	**284.0**	**-**	**(284.0)**	**-100.00%**
කාර්යාලය පුනස්ථාපනය	3.0		(3.0)	-100.00%
පවත්නා පද්ධතිය වැඩි දියුණු කිරීම	5.0		(5.0)	-100.00%
මාර්ගගත ගෙවීම් ද්වාර පද්ධතිය	1.0	-	(1.0)	-100.00%
ජෛව පද්ධති තාක්ෂණය - අඹේවෙල	25.0	-	(25.0)	-100.00%
මහපොළ විශ්වවිද්‍යාල ගම්මානය	50.0		(50.0)	-100.00%
විදේශ භාෂා විශ්වවිද්‍යාල විද්‍යාතනය	100.0		(100.0)	-100.00%
විසල් නගර ව්‍යාපෘතිය- මිහින්තලේ	100.0		(100.0)	-100.00%
සමස්ථ වියදම	**2,049.5**	**1,401.0**	**(648.5)**	**-31.64%**
ශුද්ධ ඉතිරිය	**375.5**	**1,777.6**	**105.1**	**28%**

මෙහෙයුම් සමාලෝචනය

කාර්යසාධන සමාලෝචනය - 2023 ජූනි 30න් අවසන් මාස හය සඳහා

ආදායම් ප්‍රකාශනය	2023 රු.මි.	2022 රු.මි.
ආදායම	2,091.10	1,589.23
සෘජු වියදම් (ශිෂ්‍යත්ව ගෙවීම්)	(550.47)	(683.24)
	1,540.63	**906.00**
වෙනත් ආදායම	0.33	0.24
මුළු ආදායම	**1,540.96**	**906.24**
පරිපාලන වියසම්	(30.45)	(32.90)
මූල්‍ය පිරිවැය	(0.04)	(0.04)
මුළු වියදම්	**(30.49)**	**(32.94)**
බදුවලට පෙර අතිරික්තය/ (හිඟය)	**1,510.47**	**873.30**

භාරකාර මණ්ඩල හා ආයෝජන කළමණාකරන කමිටු රැස්වීම්-2022

භාරකාර මණ්ඩල රැස්වීම් -2022

භාරකාර මණ්ඩල රැස්වීම් වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල අනුමත කරගත් අයවැය හා අදාල ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. මෙහිදී භාරකාර මණ්ඩලය සම්මත න්‍යාය පත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කල කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. සියලුම භාරකාර මණ්ඩල රැස්වීම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කොට සහතික කරයි. භාරකාර මණ්ඩලය මාස 02 කට වරක් රැස්වන අතර, අවශ්‍යතා පැන නැඟුනවිට විශේෂ භාරකාර මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලබේ. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල දී පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීම් සහ භාරකරුවන්ගේ සහභාගී වූ තොරතුරු පහත පරිදි වේ.

	භාරකරු /භාරකරුවන්	**තනතුරු නාමය**	**රැස්වීම් දිනය හා මාසය**			
			22/2/9	**22/3/8**	**22/8/4**	**22/11/1**
			93	**94**	**95**	**96**
1	ගරු ජයන්ත ජයසුරිය මහතා	අගවිනිසුරු	*	*	*	*
2	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා	වෙළඳ අමාත්‍ය	√	√	x	x
3	ගරු නලින් ප්‍රනාන්දු මහතා	වෙළඳ, අමාත්‍ය	-	-	√	√
4	හද්‍රාණි ජයවර්ධන මිය	ලේකම්, වෙළඳ අමාත්‍යාංශය	√	*	x	x
5	එස්.ටී. කොඩිකාර මහතා	ලේකම්, වෙළඳ අමාත්‍යාංශය	-	-	√	√
6	මහාචාර්ය කපිල පෙරේරා	ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	√	√	x	x
7	එම්.එන්. රණසිංහ මහතා	ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	-	-	√	√
8	එස්.වී.ඩී. කේසරලාල් ගුණසේකර මහතා	පත්කළ භාරකරු	√	√	√	√
9	ආචාර්ය රවීන්ද්‍රනාත් ලියනගේ මහතා	පත්කළ භාරකරු	√	√	x	x
10	වයි. මදුරප්පෙරුම මහතා	පත්කළ භාරකරු	-	-	√	√

√ - පවත්වන ලද හා සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව

x - භාරකාර මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ

* - සහභාගී නොවූ

ආයෝජන කමිටු රැස්වීම් -2022

	නම	අධ්‍යක්ෂ මණ්ඩල නිලය	තනතුරු නාමය	පවත්වනු ලැබූ රැස්වීම් සංඛ්‍යාව	
				1 (03.06.2022)	2 (20.09.2022)
				10 වැනි	11 වැනි
1	එස්.ටී. කොඩිකාර මහතා	සභාපති	ලේකම්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, නිල බලයෙන් භාරකරු, ම.භා.අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී		√
2	මංජුල ද සිල්වා මහතා	සාමාජික	මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී, ලංකා වාණිජ මණ්ඩලය	√	√
3	එස්.වී.ඩී. කේසරලාල් ගුණසේකර මහතා	සාමාජික	පත්කළ භාරකරු	√	√
4	ගණක අමරසිංහ මහතා	සාමාජික	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජික	√	√
5	ටී. ධර්මරාජා මහතා (FCA)	සාමාජික	අධ්‍යක්ෂ/සභාපති NWSL / NWCL	√	√
6	එම්.පී. බණ්ඩාර මහතා	සාමාජික	අධ්‍යක්ෂ- මහපොළ භාර අරමුදල	√	√

√ - පවත්වන ලද හා සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව

x - භාරකාර මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ

* - සහභාගි නොවූ

ආයතනික යහපාලනය

කාර්යය මණ්ඩලය - 2022 දෙසැම්බර් දක්වා කාර්ය මණ්ඩලයේ විස්තර පහත පරිදිය.

සේවා ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ (අධ්‍යක්ෂ, ප්‍ර.වි.නි.,ස.අ.,අ.වි.)	7	3	4
ද්විතීය	15	9	6
තෘතීය	2	2	-
ප්‍රාථමික	7	3	5
එකතුව	**31**	**16**	**15**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරණ ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.62% ක් වූ අතර වියදමින් 1.9% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබෑර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සඳහා ඇබෑර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

සමාලෝචිත වර්ෂයේදී මහපොළ භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ නිර්දේශය අනුව වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය එක් එක් සේවා කාණ්ඩයේ අවශ්‍ය සේවක සංඛ්‍යා තනතුරු සහ සුදුසුකම් ආදිය තීරණය කිරීම පිණිස බඳවා ගැනීම් පටිපාටිය සහ සංවිධාන ව්‍යුහය සමගින් සේවක සංඛ්‍යා පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම පිණිස කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ වාර්තාව වර්ෂය අවසාන වන විට අවසන් කර නොතිබුණි.

මහපොළ අරමුදලේ කාර්ය මණ්ඩලයේ සියලුම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව මගින් අනුමත කරවා ගත යුතු බව වෙළඳ අමාත්‍යාවරයා විසින් දැනුම් දුන් අතර එයට අදාල ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත 2021.03.25 දින යොමු කළ අතර අරමුදලේ ස්වාධීන පැවැත්ම තහවුරු කිරීම පිණිස සඳහා වන නෛතික විධිවිධාන 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාත්ව භාරකාර අරමුදල් පනතේ අන්තර්ගත කර ඇති බැවින් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ පොදු මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී. ඒ අනුව ම: ශි: භාර අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටිය (SOR) මහපොළ භාරකාර මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මහපොළ භාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

මහපොළ භාර අරමුදලේ රු. මිලියන 2.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය කොට ඇති අතර මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙකු සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිල බලයෙන් පත්වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයන ආදායම ජනාධිපති අරමුදලට කෙලින්ම මාරු කරන අතර ඉන්පසුව මහපොළ අරමුදලට හිමි ලාභ කොටස ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කරනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2018 - 2022 ලාභය හා ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මාරුකරන ලද ලාභාංශ

විස්තරය	2018	2019	2020	2021	2022
	රු.මි	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය	**501.7**	**2,187.60**	**2,668.80**	**2,770.00**	**3,210.68**
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට හිමි කොටස 50%	250.9	1,093.80	1,334.40	1,385.00	1,381.77
මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කල කොටස	**25**	**780.6**	**922.3**	**1,153.30**	**1,381.77**
තවදුරටත් ලැබිය යුතු ලාභ කොටස	313.2	412.1	231.7	424.8	266.80

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම (NWCL)

මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය යටතේ නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) හි රුපියල් මිලියන 200 ක් ආයෝජනය කරමින් සීමිත සමාගමක් ලෙස 2003 මාර්තු 23 වන දින සංස්ථාගත කරන ලදී. නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් ආයෝජන කළමණාකරුවෙකු ලෙස කටයුතු කල අතර මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන කළඹ අඩු අවදානමකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අභිප්‍රායෙන් කළමනාකරන ගිවිසුමක් යටතේ ලබා දෙන ලදී. එලෙස නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමණාකරනය කරන ලද මහපොළ අරමුදල 2019 වර්ෂයේ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ඇති මහ පොළ ප්‍රධාන ගිණුමට මාරු කරන ලද අතර 2019 පෙබරවාරි 28 වන දින සිට නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ තිබූ අරමුදල් කළමනාකරණ ගිවිසුම අවලංගු කරන ලදී.2022 වර්ෂය තුල ක්‍රියාකාරී නොවන සමාගමක් ලෙස එය පැවතුණි. 2022 වර්ෂය සලකා බැලීමේදී මූල්‍ය තත්වය පහත පරිදි විය.

2022.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව

	2022 (රු.මි.)	2021 (රු.මි.)
ආදායම	1.95	0.93
වියදම්	1.29	3.85
ශුද්ධ ලාභය (අලාභය)	**0.66**	**(2.92)**

2022.12.31 දිනට මූල්‍ය තත්වය

වත්කම්	2022 රු.මි.	2022 රු.මි
මුදල් හා සමාන දෑ	0.82	0.06
ස්ථාවර තැන්පතු හා කෙටි කාලීන තැන්පතු	16.00	15.02
තැන්පතු, කලින් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ	59.48	59.22
අනුබද්ධ සමාගම්වල ආයෝජන - NWSL	1,148.60	1,148.60
අනෙකුත් වත්කම්	34.70	35.20
මුළු වත්කම්	**1,259.60**	**1,258.10**

හිමිකම් හා වගකීම්	රු.මි.	රු.මි
වියදම්		
කොටස් ප්‍රාග්ධනය	985.50	985.50
2021.12.31 දිනට රඳවා ගත් ලාභ	272.45	271.41
මුළු හිමිකම්	1,257.95	1,256.91
වගකීම්	1.65	1.19
මුළු හිමිකම් හා වගකීම්	**1,259.60**	**1,258.10**

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

නැට් වෙල්ත් සිකියුරිටීස් සමාගම (NWSL)

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ උප සමාගමක් වශයෙන් NWSL ආරම්භ කළ අතර 2003 වර්ෂයේ සිට අඛණ්ඩව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගැනුම්කරුවකු ලෙස කටයුතු කළ අතර 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සමාගම ලැබූ අලාභය හේතුවෙන් හා සමාගම පවත්වාගෙන යාමට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය ඌනතාවය මත භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා සහභාගී වීම අවම මට්ටමක පැවතුනි. මෙම කළමනාකරණ දුර්වලතා හේතුවෙන් හා ඉතා කෙටි කාලයක් තුල අධ්‍යක්ෂ මණ්ඩලවල වෙනස්වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් NWSL සමාගමේ ප්‍රාථමික ගැනුම්කාර බලපත්‍රය මාස 06 ක් සඳහා තාවකාලිකව අත්හිටුවන ලදි. එය 2020 මැයි මස සිට 2020 නොවැම්බර් 30 දක්වා ක්‍රියාත්මක වීම හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරීඋයට සෘජුවම බලපෑ අතර එමඟින් ආදායම් අහිමිවීමක් ද සිදුවිය.

2020.10.26 වන දින පැවති අමාත්‍ය මණ්ඩලයේදී අනුමත කළ පරිදි NWCL සහ NWSL සමාගම් ඇවර කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව 2021.12.31 වන විට එම ඇවර කිරීමේ කටයුතු වල ප්‍රගතිය පහත පරිදි විය.

1. 2021 මාර්තු සියලුම සේවකයින් ගේ සේවය අවසන් කරන ලද අතර නියමිත වන්දි මුදල් හා පාරිතෝෂික ගෙවා දමන ලදී.

2. ගෙවිය යුතු ණය හිමි ශේෂ අතර වූ Trillian Securities සමාගමේ ණය පියවීම සඳහා අවසාන ගෙවීමක් වශයෙන් රු. මි. 95 ක් ගෙවා ණය අවසන් කරන ලදී.

3. දේශීය ආදායම් දෙපාර්ථමේන්තුවට ගෙවිය යුතු සියළුම ආදායම් හා වැට බදු ගෙවීම සඳහා එකඟතාවයකට පැමිණි අතර සියළුම බදු මත පනවන ලද දණ්ඩනය ඉවත් කිරීමට දේ: ආ: දෙපාර්ථමේන්තුව එකඟ වූ අතර 2022 මාර්තු මස හිඟ බදු වලින් රු: මිලියන 304 ක් ගෙවූ අතර ඉතිරි රු: මිලියන 100 ක මුදල වාරික 12 කින් ගෙවීමට එකඟ විය.

4. තවදුරටත් ගෙවිය යුතු ණය හිමියන් අතර ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් ණය හිමියකු වූ වර්වුවල් ඉන්වෙස්ට්මන්ට් සමාගම ට ගෙවිය යුතු ණය පිළිබඳ අවසන් එකඟතාවයකට සමාලෝචිත වර්ෂයේදී එළඹෙන ලදී. ඒ අනුව අදාළ ණය පියවීම සම්බන්දයෙන් පත් කළ කමිටුවේ නිර්දේශය අනුව අදාළ ණය හිමියා සමග සාකච්ඡා කොට අවසන් එකඟතාවයකට එළඹී අතර ඒ අනුව ණය හිමියා සමග කමිටුව පැවැත්වූ සාකච්ඡාවලට අනුව ණය පියවීම පිණිස ගෙවීමට එකඟ වූ අවසන් මුදල රු. මිලියන 325 ක් වූ අතර ඉන් රුපියල් මිලියන 250 ක් සැප්තැම්බර් මාසයේදී ගෙවූ අතර ඉතිරි රු. මිලියන 75 රු. මිලියන 37.5 බැගින් වූ වාරික දෙකකින් ගෙවා 2022 නොවැම්බර් 15 දිනට මුළු බැරකම පියවන ලදී.

2022 වසර තුළ සමාගම කිසිදු මෙහෙයුමක් නොකළ අතර NWSL හි සම්පූර්ණ අරමුදල කළමනාකරණ ගිවිසුමක් අනුව 2022 වසරේදී මහපොළ භාර අරමුදලට පවරන ලද අතර මහපොළ භාර අරමුදල හා NWCL අතර ගනුදෙනුව වාර්තා කිරීම පිණිස අන්තර් සමාගම් ජංගම ගිණුම පමණක් පවත්වා ගෙන යනු ලැබේ.

2022 වසර තුළ ගනුදෙනුවේ සාරාංශය පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

2022.12.31 දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා කාර්යසාධන වාර්තාව

	2022 (රු.මි.)	2021 (රු.මි.)
ආදායම	150.45	60.61
නොපියවූ REPO මත පොළී වියදම	289.73	40.84
වියදම්	157.19	37.65
ශුද්ධ ලාභය/ (අලාභය)	**(296.47)**	**(17.88)**

2022.12.31 දිනට මූල්‍ය තත්ත්වය

වත්කම්	2022 (රු.මි.)	2021 (රු.මි.)
මුදල් හා සමාන දෑ	0.62	45.86
ස්ථාවර තැන්පතු හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්	2.00	1,064.53
තැන්පතු, කලින් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ	576.28	175.94
අනෙකුත් වත්කම්	0.07	0.13
මුළු වත්කම්	**578.97**	**1,286.46**

හිමිකම් හා වගකීම්	2022 (රු.මි.)	2021 (රු.මි.)
ප්‍රකාශිත ප්‍රාග්ධනය	1,175.00	1,175.00
විශේෂ අවධානම් සංචිත	354.04	354.04
2022.12.31 දිනට රඳවා ගත් ලාභ	(1,019.30)	(717.78)
මුළු හිමිකම්	509.74	811.26
වගකීම්	69.23	475.20
මුළු හිමිකම් හා වගකීම්	**578.97**	**1,286.46**

ගනුදෙනු සාරාංශය

සමාගමේ/අස්තිත්වයේ නම	සබඳතාව	ගනුදෙනුවේ ස්වභාවය	ගනුදෙනුවේ වටිනාකම	ගෙන්/(වෙත) ලැබිය යුතු
නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම (NWSL)	පොදු අධ්‍යක්ෂ	NWSL වෙතින් ස්ථාවර වත්කම් මිලදි ගැනීම	148,950	(148,950)
	පොදු අධ්‍යක්ෂ	අරමුදල් පැවැරීමේ ගිවිසුම යටතේ NWSL වෙතින් මහපොළ භාර අරමුදලට ලැබුණු අරමුදල්.	850,000,000	(850,000,000)
		ආයෝජනයෙන් ලැබුණු ආදායම	126,500,344	(126,500,344)
		භාණ්ඩාගාර බිල්පත් අයෝජන	593,798,500	(593,798,500)
		NWSL වෙත අරමුදල් පැවැරුම	396,828,400	396,828,400
		ස්ථාවර තැන්පතුවල ආයෝජනය	450,000,000	-
		ස්ථාවර තැන්පතු කල්පිරීම	450,000,000	-

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි ආයෝජන (SLIIT)

2015 මැයි 12 දින ඇති කර ගන්නා ලද ගිවිසුම් භාරකරුවන්ගේ නිසි අනුමැතියකින් තොරව සිදු කොට ඇති අතර ඒ පිළිබඳව විශේෂ විමර්ෂණයක් ජනාධිපති විමර්ෂණ කොමිසම විසින් සිදු කල අතර විගණකාධිපති වරයාගේ විශේෂ වාර්තාව අනුව මෙම මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ වත්කම් පැවරීම නිසි අනුමැතියකින් තොරව සිදු කොට ඇති බැවින් SLIIT හි පරිපාලනය නැවත මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිහිටුවීම COPE කමිටුව තීරණය කොට ඇත. දැනට SLIIT ආයතනය සතුව රු.බි.20කට අධික දළ වත්කම් වටිනාකමක් ඇති බව නිරීක්ෂණය වන අතර ඒ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට මහපොළ භාරකාර මණ්ඩලය කටයුතු කළ අතර, ඒ සඳහා SLIIT හි වර්තමාන පාලන අධිකාරිය අවශ්‍ය පහසුකම් ලබා දීමට එකඟ නොවීම මත එම වත්කම් තක්සේරු කටයුතු සිදු නොකළ අතර එමගින් මහපොළ අරමුදලට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී ඇත.

2021 ඉදිරි පත් කරන ලද අමාත්‍ය මණ්ඩලයේ සංදේශය අනුව SLIIT ආයතනය සමග එළඹී ගිවිසුම් සාවද්‍ය හා නිසි අනුමැතියකින් සිදු කොට නැති බව නිරීක්ෂණය කොට SLIIT හි පරිපාලණ ව්‍යුහය 2015.05.12 වැනි දිනට පෙර පැවති තත්වයෙන් පවත්වාගෙන යා යුතු බවට තීරණය කරන ලදී. ඒ අනුව මහපොළ භාරකාර මණ්ඩලය අවශ්‍ය පියවර ගනිමින් පවතී. 2020 වර්ෂයේ SLIIT ආයතනය රු. මී. 500 කට අධික ලාභයක් ලබා ඇති අතර එය මහපොළ අරමුදලට ගෙවිය යුතු ලාභ කොටසකි.මෙය අඩු පහසුකම් සහිත පවුල් වල දරුවන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම් අහිමි කොට ඇති අතර මේ පිළිබඳ සියළු දෙනාගේ අවධානය යොමු වේවායි බලාපොරොත්තු වේ.

තවද, මහපොළ භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ තීරණය ප්‍රකාරව, මහපොළ භාර අරමුදල වෙත SLIIT ආයතනයේ ලාභ කොටස ලබා ගැනීමට අදාළ ගැටලු විසඳීම සඳහා ඉදිරි කටයුතු කිරීම පිණිස අදාළ ගිවිසුම්, අමාත්‍ය මණ්ඩල තීරණ සහ අනෙකුත් සම්බන්ධිත කමිටු තීරණ සමාලෝචනය පිණිස පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2023 වසරේදී පත් කරනු ලැබීය.

(1) ලේකම්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
(2) ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
(3) නීතිපති දෙපාර්තමේන්තුවේ එක් සාමාජිකයකු

SLIIT ආයතනය සමග එළඹී ගිවිසුම නැවත සලකා බැලීම පිණිස එම කමිටුවේ අවසන් වාර්තාව මහපොළ භාර අරමුදලේ විෂය භාර අමාත්‍යවරයා වන වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස එය මහපොළ භාර අරමුදලේ භාරකාර මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඪ භාර අරමුදල මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ව්‍යාපෘති (2022 – 2025)

නව ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	ප්‍රාග්ධන ආයෝජනය රු.මි.	අපේක්ෂිත වාර්ෂික ආදායම රු.මි.
ශිෂ්‍යාඪලාභීන්ගේ දත්ත පද්ධතිය	-	200
පාදුක්ක මල්ලැව වත්ත යෝජිත විශ්ව විද්‍යාල ගම්මානය (අක්. 123)	200	300
මහපොළ සඳහා මාර්ගගත ලොතරැයිය	-	300

ශිෂ්‍යාත්වලාභීන් සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීම

වත්මනෙහි, තම විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු නිමා කොට දේශීයව හා විදේශීයව විවිධ රැකියාවන්හි හා වෘත්තීන්හි නිරත ශිෂ්‍ය සංඛ්‍යාව ලක්ෂ 03 ක් පමණ වන අතර එම ශිෂ්‍යාත්වලාභීන් පිළිබඳ දත්ත සමුදායක් සකස් කර ඇති අතර මහපොළ භාර අරමුදලට යම් දායකත්වයක් ලබා දෙන ලෙස එම දත්ත භාවිතා කරමින් මඑ සියලු ශිෂ්‍යාත්වලාභීන්ගෙන් ඉල්ලීමක් කිරීමට නියමිතය. මෙම කාර්යය සඳහා, සෘජු බැංකු ගෙවීම් (මාර්ගගත ගෙවීම් ද්වාරය) පහසුකම් මහජන බැංකුවෙන් ලබා ගෙන ඇති අතර මහපොළ නමින් ෆේස්බුක් පිටුවක් සහ යූටියුබ් නාලිකාවක් දියත් කිරීමට යෝජනා වී තිබේ. ඒ සමගින්, පුවත්පත් දැන්වීම් සහ විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් අරමුදල් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට වැඩ කටයුතු යොදා තිබේ. අරමුදලට අමතරව, රු. මිලියන 500 ක පමණ අරමුදලක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

හරිත විශ්වවිද්‍යාල ගම්මානය (Green University Village)

එසේම හෝමාගම පාදුක්ක ප්‍රදේශයේ අක්කර 123 ක භූමි භාගයක ජාත්‍යන්තර හරිත විශ්වවිද්‍යාල ගම්මානයක් ස්ථාපිත කිරීමට ද සැලසුම් සකස් කර තිබේ. මෙය අදියර දෙකක් යටතේ සිදු කිරීමට නියමිත අතර පළමු අදියරේදී තාක්ෂණික දැනුම ප්‍රචලිත කිරීමේ අරමුණින් තාක්ෂණික විශ්වවිද්‍යාලයක්, පුහුණු මධ්‍යස්ථානයක් සහ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මේ සඳහා ආයෝජනය කිරීම පිණිස අභිලාෂය පළකිරීමේ යෝජනා 2021 වසරේදී කැඳවූ අතර විදේශ විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් පාර්ශව තුනක් අභිලාෂය පළ කොට ඇති අතර දේශීය ආයෝජනය ඇතුළු සමස්ත ආයෝජනය රු. බිලියන 20කි. මෙම කාර්යය සඳහා අවශ්‍ය ඉඩම (අක්කර 123) නාගරික සංවර්ධන අධිකාරියෙන් 99 අවුරුදු කල්බදු පදනමින් ලබා ගෙන ඇති අතර ඒ සඳහා වූ රුපියල් මිලියන 340 ක මුදල 2021 දෙසැම්බර් වන විට ගෙවා නිම කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය 2023 වසරේදී ආරම්භ කිරීමට යෝජිත අතර 2024 වසරේ සිට සිසුන් බඳවා ගැනීමට අපේක්ෂා කරයි. දේශීය හා විදේශීය ශිෂ්‍යයන් 10,000කට පමණ අධ්‍යයන අවස්ථා පිරි නැමීමට නියමිත අතර මෙම ව්‍යාපෘතිය වත්මන් විදේශ විනිමය අර්බුදයට ද යම් විසඳුමක් ලැබෙන ආකාරයෙන් සැලසුම් කර තිබේ. මෙහි සමස්ත ආයෝජනය රු. මිලියන 200 ක් වන අතර අපේක්ෂිත වාර්ෂික ආදායම රු. මිලියන 300 කි.

මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. TAC/E/MTF/01/22/03

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 31 දින

සභාපති

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම්

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 07 ඡේදයට අනුකූල නොවී, ඉතා කෙටි කාල සීමාවක් තුළ මුදල් බවට පත්කළ හැකි රු.1,328,206 ක් වටිනා වූ කෙටි කාලීන ආයෝජන වටිනාකමක් " මුදල් සහ මුදල් සමාන දෑ " යටතෙහි නොදක්වා දිගුකාලීන වත්කමක් වශයෙන් " මූල්‍ය වත්කම් " යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම ශ්‍රී.ලං.ගී.ප්‍ර අංක 08 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම් ගත කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.14,232,124ක් වූ අරමුදලේ ලී බඩු හා සවි කිරීම්, කාර්යාල උපකරණ හා පරිගණක උපාංගවල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79(ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද සහ තවමත් භාවිතයට ගනු ලබන ඉහත වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී ක්‍රියාත්මක වූ මහපොළ මංගත ලොතරැයිය අවලංගු කිරීම සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බෙරුම්කරණ ක්‍රියාවලිය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට රු.1,328,206 ක "Sweeper ඉතුරුම් ගිණුම්" ශේෂය සනාථ කිරීමට අදාල බැංකු ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාර අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය භාර අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාර අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ "ඇ" හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (අ), (ඇ) සහ (ඊ) ඡේද	ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී අරමුදලේ සංවිධාන ව්‍යුහය , අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර , වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර නොතිබුණි.
(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, අරමුදලට අයත් වාහන දෙක වෙනුවෙන් එම කාර්යය නියමිත පරිදි ඉටු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසු සියළුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයක් පිරිනැමීම ඉලක්ක කර තිබුණ ද, දෙමාපියන් විසින් උපයනු ලබන වාර්ෂික ආදායම රු.500,000 ට අඩු නිර්ණායක පදනම් කර ගැනීම හේතුවෙන් 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාලව මහපොළ ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලද සිසුන් 26,000ක් අතරින් සිසුන් 16,000 කට පමණක්, එනම් සියයට 61.5 ක් වැනි අඩු ප්‍රතිශතයක සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි.

(ආ) 2022 මාර්තු 01 දින සිට 2023 පෙබරවාරි 28 දක්වා වලංගු වන පරිදි අත්සන් කරන ලද 2022 මාර්තු 15 වන දිනැති අංක 756 දරන බදු ගිවිසුමේ 4 (C) වගන්තිය අනුව රු.25,000 ට අඩු සුළු අළුත් වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු, බදු ගැණුම්කරු (අරමුදල) විසින් සිදුකළ යුතු අතර, සියළු ප්‍රධාන හා ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු බදු දීමනාකරු විසින් සිදුකළ යුතු බව සඳහන් වුවත්, ගොඩනැගිල්ලේ තීන්ත ආලේපන කටයුතු සඳහා රු.93,750 ක් ද, ආලෝකකරණය වෙනුවෙන් ගොඩනැගිල්ල තුල නැවත සවිකිරීම් ප්‍රතිස්ථාපනය සඳහා රු.69,000 ක් ද, අරමුදල විසින් දරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් 08 ක ඉලක්ක වෙත ලඟා වීමට හා ක්‍රියාකරකම් ඉටු කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ඈ) පාසල්වල සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසල් සංවර්ධන සමිති වෙත ගෙවිය යුතු රඳවා ගත් මුදල්වල එකතුව වූ රු.3,832,875 ක වටිනාකමක් 2013 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 10 ක් නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී ද ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 16 ක් වූයෙන් තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි.එම පුරප්පාඩු අතරින්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සහ ද්විතීය මට්ටමේ තනතුරු 06 ක් පැවති අතර, එම තනතුරු වර්ෂ දෙකක සිට පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණන පිළිතුරු

ලලිත් ඇතුලත් මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අංක 19 දරණ විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව ට අදාල පිළිතුරු හා පැහැදිලි කිරීම්

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම්

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	නව නිරීක්ෂණයක්ද/ පවත්නා නිරීක්ෂණයක්ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
(අ) **ශ්‍රී** ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 ඡේදයට අනුව යම් අස්ථිත්යයක වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් එකිනෙකට ගලපා දැක්වීම සිදු නොකළ යුතු වුවත්, අරමුදලේ බැංකු ජංගම ගිණුමෙහි වූ රු159,325.ක අයිරාව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් තුළ නොදක්වා, ජංගම වත්කමක් වූ රු 64,200,000 .ක වටිනාකමැති "එක් දින ආයෝජන" ශේෂය සමග ගැලපුම් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ " මුදල් සහ මුදල් සමාන දෑ " තුළ දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මහපොළ අරමුදලේ උපදෙස් පරිදි බැංකුව විසින් දිනය අවසානයේ ගනුදෙනු පියවීමට ප්‍රථම එදිනට ගෙවීමට ඉදිරිපත් කල චෙක්පත් සඳහා ගෙවීම් සිදුකොට තවදුරටත් ඉතිරි ශේෂය එක් දින රාත්‍රී (Overnight Deposit) තැන්පතුවක් වශයෙන් තබාගෙන ඒ සඳහා නිශ්චිත පොළියක් ලබාදීම සිදු කරයි. 2022.12.31 දිනට මහපොළ අරමුදල විසින් නිකුත් කරන ලද නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත්වල ශේෂය රු.159,325 /- ක් වූ අතර බැංකුව 2023.12.31 දිනට මෙම චෙක්පත් ඉදිරිපත් නොවූ බැවින් හා එක්දින තැන්පතුව ඊළඟ දිනයේ ගිණුමට බැර කරන බැවින් මහපොළ අරමුදලේ උපදෙස් මත එක් දින තැන්පතුවක් සඳහා යොමු කරයි. එවිට මහපොළ අරමුදල ඉදිරිපත් නොවූ චෙක්පත් සඳහා ශේෂය වෙන් කිරීමක් නොකොට දිනය අවසානයේ ඇති බැංකු ශේෂය එක් දින තැන්පතුවක් සඳහා යොමු කරයි. මෙය	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ.	2023 වර්ෂයේ සිට ඉදිරියට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන හා වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

			ප්‍රායෝගික තත්ත්වයක් වන අතර අරමුදල විසින් ගිණුමේ මුදල් නොමැතිව චෙක්පත් නිකුත් කරනු නොලැබේ. නමුත් අවසන් ගිණුම්වල බැංකු අයිරාවක් ලෙස දැක්වීම යෝග්‍ය නොවන බැවින් එම ඉදිරිපත් නොකල චෙක්පත්වලට අදාල ශේෂය එක් දින තැන්පතුවෙන් අඩුකොට ගිණුම්වල දැක්වීම සිදුකොට ඇත. 2023 වර්ෂයේ සිට වර්ෂ අවසාන එදිනට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත්වල ශේෂයට සමාන මුදලක් ගිණුමේ රඳවා ඉතිරි ශේෂය පමණක් එක් දින තැන්පතු සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.		
(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 07 ඡේදයට අනුකූල නොවී, ඉතා කෙටි කාල සීමාවක් තුළ මුදල් බවට පත්කළ හැකි රු.1,328,206 ක් වටිනා වූ කෙටි කාලීන ආයෝජන වටිනාකමක් “ මුදල් සහ මුදල් සමාන දෑ ” යටතෙහි නොදක්වා , “ මූල්‍ය වත්කම් ” යටතේ ඉදිරිපත් කර තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟවේ. එය ගිණුම්කරණ අඩුපාඩුවක් වේ ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ.	2023 වර්ෂයේ සිට ඉදිරියට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන හා වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
(ඇ)(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස් කම ශ්‍රී.ලං.ගී.ප්‍ර. අංක 08 ප්‍රාකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟවේ. ඉදිරි මූල්‍ය වර්ෂයේ දී ලියාහරින ලද, තවදුරටත් භාවිතයේ ඇති සියලුම වත්කම් සුදුසු අධීක්ෂණ මණ්ඩලයක් යටතේ ප්‍රත්‍යාගනනය කොට ගිණුම්ගත කිරීමට හා ඒ අනුව ගිණුම් කරන ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ.	වත්කම් ප්‍රත්‍යාගණනය සම්බන්ධව අනුමැතිය සඳහා භාරකාර මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කොට ඇත.

වෙනසක් ලෙස ගිණුම් ගත කළ යුතුය. කෙසේ වෙතත් 2022 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.14,232,124ක් වූ අරමුදලේ ලී බඩු හා සවි කිරීම්, කාර්යාල උපකරණ හා පරිගණක උපාංගවල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.					
(ii) ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරණ ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද සහ තවමත් භාවිතයට ගනු ලබන සංස්ථාවට අයත් ලී බඩු හා සවිකිරීම්, කාර්යාල උපකරන හා පරිගණක උපාංගවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ඉදිරි ගිණුම් වර්ෂයේ දී අදාල හෙලිදරවු කිරීම් සිදුකරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ.	ඉදිරි ගිණුම් වර්ෂවලදී නිවැරදිව ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත.
(ඇ) මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල වෙනුවෙන් 2013 වර්ෂයේ දී ආරම්භ කරන ලද මාර්ගගත ලොතරැයිය 2016 සැප්තැම්බර් 15 දින සිට අවලංගු කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බෙරුම්කරණ ක්‍රියාවලිය පිළිබඳව විස්තර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	එකඟවේ. ඉදිරි ගිණුම් වර්ෂයේ දී අදාල හෙලිදරවු කිරීම් සිදුකරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව නිසි හෙලිදරවු කිරීම් සිදුකල යුතුය.	ඉදිරි ගිණුම් වර්ෂවලදී නිවැරදිව ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත.

1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මේ පිළිබඳ විගණන කමිටුවේදී ද සාකච්ඡා කල අතර ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ අවසන් මතයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇති අතර එය අධ්‍යයනය කරමින් පවතී. එය ලැබුණු පසු අවසන් තීරණයක් ගැනීමට නියමිත අතර මහපොළ අරමුදලේ වාර්ෂික වාර්තාවේ උක්ත පාලිත සමාගම්වල ගිණුම් විස්තර ද ඉදිරිපත් කරනු ලැබේ. දැනට එම පාලිත සමාගම්වල ආයෝජනයෙන් කොටස් ආයෝජනය ලෙස පමණක් ගිණුම්වල දක්වා ඇත.	ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ.	සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් මතයක් ලබා ගැනීම සඳහා කටයුතු කොට ඇති අතර එම මතය ලැබුණු පසු එහි නිර්දේශය අනුව ඉදිරියට ගිණුම් කටයුතු සිදු කරනු ලැබේ.

1.4.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
බැංකු ශේෂ.	1,328,206	2022 දෙසැම්බර් 31 දිනට වූ Sweeper ඉතුරුම් ගිණුම් ශේෂය සනාථ කිරීමට අදාල බැංකු ශේෂ සනාථන.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එක් දින ආයෝජන සඳහා හා Sweeper ඉතුරුම් ගිණුම සඳහා සනාථ කිරීම් (ඡායා පිටපතක් මගින්) විගණනය සිදු කරන කාල සීමාව තුලද ලබා දී ඇත.	අදාල ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.	2023 වසරේ සිට මාසික බැංකු ප්‍රකාශන මාසිකව ලබා ගන්නා අතර ශේෂ සනාථ විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
සමූපකාර තොග වෙළඳ සංස්ථා (ස.තො.ස) ගොඩනැගිල්ල කුලී පදනම මත භාවිතා කිරීම හේතුවෙන්, අරමුදල විසින් ස.තො.ස වෙත ලබා දෙන ලද රු.348,810 ක ආපසු ගෙවනු ලබන කුළී තැන්පතුවක්, එම ගොඩනැගිල්ලෙන් ඉවත් වී වර්ෂ 05ක් ගතවීමෙන් පසුවද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	රු. 348,810 මුදල නැවත අයකර ගැනීම සඳහා වරින් වර ලිපි හා ඊට අදාල බැංකු ප්‍රකාශන යවා ඒ සම්බන්ධව ක්‍රියා කලද තැන්පතු මුදල මහපොළ අරමුදල වෙත ලබා දීමට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව කටයුතු කර නොමැත.	ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ.	සිහි කැඳවීම් යැවීමට කටයුතු කොට ඇති අතර තැන්පතුව තබන අවස්ථාවේ නිකුත් කළ ගෙවීම් ලදුපත ඉදිරිපත් කරන ලෙස සතොස මගින් දන්වා ඇත. එය දැනට මහපොළ අරමුදල සතුව නොමැති බැවින් ගෙවීම් තහවුරු යවා ඇත.

1.5.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
පාසල්වල සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසල් සංවර්ධන සමිති වෙත ගෙවිය යුතු රඳවා ගත් මුදල්වල එකතුව වූ රු.3,832,875 ක වටිනාකමක් 2013 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 10 ක් නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී ද ගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මෙම ගෙවීම්වලට අදාල අවසන් බිල්පත් ඉදිරිපත් කොට නොමැතිවීම හා අදාල ව්‍යාපෘතීන් නිම නොකිරීම මත මෙම ගෙවීම් අත්හිටුවා ඇත.	ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සිදුවී ඇති බැවින් හා ණයහිමියන්ගේ බිල්පත් ඉදිරිපත් කොට නැති බැවින් ගෙවීම් කිරීමට නොහැකිවී ඇත. මෙම සියළු කොන්ත්‍රාත් සතොස ඉංජිනේරු සමාගම හරහා සිදුකොට ඇති අතර එම ලිපිගොනු දැනට සතොස ඉංජිනේරු ආයතනයේ නොමැති බව දන්වා ඇති අතර අදාල ගෙවීම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
(අ)මුදල් රෙගුලාසි 756	2023 අප්‍රේල් 25 දින තෙක්ම, 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	භාණ්ඩ සමීක්ෂණ සඳහා කමිටුවක් පත්කොට අදාල සමීක්ෂණ කටයුතු අවසන් කොට ඇත. කමිටු සභාපතිගේ වාර්තාව ලැබුණු පසු විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ.	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව2023.07.13 වන දින ලැබුණු අතර විගණනය අවසන් කරන විට අවසන් වාර්තාව සකස් කොට නොතිබුණි..
(ආ) 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය (i) 04 ඡේදය (අ) ,(ඇ) සහ (ඊ) වගන්ති	ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ සංවිධාන ව්‍යුහය , අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අරමුදලේ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ප්‍රසම්පාදන සැලැස්ම සකස්කොට ඇති අතර, විගණන සැලසුම ද සකස් කොට ඇත. 2023 වර්ෂය සඳහා අදාල ක්‍රියාකාරී සැලසුම් සැකසීමේ දී ඉහත සියලු සැලසුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	2023 වසරේ ක්‍රියාකාරී සැලැස්ම, ඉදිරිපත් කිරීමට කටයුතු කොට ඇත.

(ii) 04 (ආ) ඡේදය	වාර්ෂික අයවැය ලේඛණය තුළ ව්‍යාපෘතිවලින් ලැබීමට අපේක්ෂිත අදායම ඇස්තමේන්තු කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	වාර්ෂික අයවැය ලේඛනය තුළ ප්‍රාග්ධන ව්‍යාපෘති ආරම්භ අවදියේ ඇති බැවින් 2022 වර්ෂය සඳහා ලැබෙන ආදායම් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිවිය. ඉදිරියේ දී නිශ්චිතව හඳුනාගන්නා සියලු ආදායම් අයවැය ලේඛනයට ඉදිරිපත් කරනු ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	ඉදිරියේ දී නිශ්චිතව හඳුනාගන්නා සියලු ආදායම් අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කරනු ඇත.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, අරමුදලට අයත් වාහන දෙක වෙනුවෙන් එම කාර්යය නියමිත පරිදි ඉටු කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සංචිත වාහනයට අදාල ඉන්ධන දහනය පිළිබඳ සියලු වාර්තා මාසිකව විගණකාධිපතිවරයා වෙත ලබාදී ඇත. වෙන්කල වාහනයට අදාල ඉන්ධන දහනය ගණනය නොකෙරෙන අතර නිලධාරියා සඳහා ඉන්ධන දීමනාව මාසිකව ලබාදෙනු ලැබේ.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	2023 වර්ෂයේ ඉන්ධන වාර්තා විගණකාධිපති වෙත ලබාදෙනු ලැබේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,746,616,255 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,292,729,814 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.453,886,441 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආයෝජන ආදායම රු.614,495,964 කින් එනම් සියයට 53 කින් වැඩි වීම සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලද ලාභ කොටස රු.151,768,390 කින් එනම් සියයට 12.33 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
(අ) 2022 මාර්තු 01 දින සිට 2023 පෙබරවාරි 28 දක්වා වලංගු වන පරිදි අත්සන් කරන ලද 2022 මාර්තු 15 වන දිනැති අංක 756 දරන බදු ගිවිසුමේ 4 (C) වගන්තිය අනුව රු.25,000 ට අඩු සුළු අළුත් වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු, බදු ගැණුම්කරු (අරමුදල) විසින් සිදුකළ යුතු අතර, සියළු ප්‍රධාන හා ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු බදු දීමනාකරු විසින් සිදුකළ යුතු බව සඳහන් වුවත්, ගොඩනැගිල්ලේ තීන්ත ආලේපන කටයුතු සඳහා	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	රු.93,950 වැය කරන ලද්දේ අලුත්වැඩියා සඳහා නොව කාර්ය මණ්ඩලය සඳහා මූල්‍ය නිලධාරියෙකු බඳවා ගැනීම නිසා අවශ්‍ය ඉඩ පහසුකම් පුළුල් කිරීම සඳහා සිදුකරන ලද ඉදිකිරීම් සඳහා මෙම මුදල වැයවී ඇත. එය අලුත්වැඩියාවක් නොවේ. ඒ අනුව රු.25,000 සීමාව බල නොපානු ඇත.	බදු ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය.	ඉදිරි ගිණුම් වර්ෂවලදී නිවැරදිව කටයුතු කරනු ඇත.

රු.93,750 ක් ද, ආලෝකකරණය වෙනුවෙන් ගොඩනැගිල්ල තුල නැවත සවිකිරීම් ප්‍රතිස්ථාපනය සඳහා රු.69,000 ක් ද, අරමුදල විසින් දරා තිබුණි.					
(ආ) විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසු සියළුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයක් පිරිනැමීම ඉලක්ක කර තිබුණ ද, දෙමාපියන් විසින් උපයනු ලබන වාර්ෂික ආදායම රු.500,000 ට අඩු නිර්ණායක පදනම් කර ගැනීම හේතුවෙන් 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාලව මහපොළ ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලද සිසුන් 26,000 ක් අතරින් සිසුන් 16,000 කට පමණක්, එනම් සියයට 61.5 ක් වැනි අඩු ප්‍රතිශතයක සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	අරමුදලේ වර්තමාන ආදායම අනුව විශ්ව විද්‍යාල වලට තේරීපත් වන සියලු සිසුන් සඳහා මහපොළ අරමුදල මගින් ශිෂ්‍යත්ව ගෙවීමේ හැකියාවක් නොමැත. වාර්ෂික ශිෂ්‍යත්ව 16,000 ලබා දෙන අතර ඒ සඳහා රු.බිලියන 02 කට ආසන්න මුදලක් වැය වේ. ඉදිරියේ දී අරමුදලේ ආදායම ඉහල නැංවීම තුල ඉහත ශිෂ්‍යත්ව සංඛ්‍යාව 16,000 යම් ප්‍රමාණයකින් වැඩි කිරීමේ හැකියාව ඇත.	ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. 1) මහපොළ මංගත ලොතරැයිය (Online Lottery) 2). ශිෂ්‍යත්ව ලාභීන්ගේ දත්ත පද්ධතියක් මඟින්. (Ex – Mahapola Recipients) 3). මිල්ලෑව වත්ත විශ්ව විද්‍යාල ගම්මානය. 4). ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය () ගිවිසුම නැවත සකස් කිරීම හා ඒ අනුව වාර්ෂික ලාභයෙන් කොටසක් මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා ලබා ගැනීම.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
(අ) සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් පහත සඳහන් ක්‍රියාකරකම් 08 ක ඉලක්ක වෙත ලඟා වීමට අරමුදල අපොහොසත් වී තිබුණි. (i) ශිෂ්‍යත්වයක වටිනාකම රු.5,000 සිට රු.7,000 දක්වා ඉහළ නැංවීම, (ii) දැනට සලකා බලන පවුලේ වාර්ෂික ආදායම් සීමාව රු.500,000 සිට රු.700,000 දක්වා ඉහළ නැංවීම. (iii) සිසුන්ට රු.10,000 ක් වටිනා ණය කාඩ්පතක් ලබා දීම.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	අපේක්ෂිත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම නිසා අපේක්ෂිත ආදායම් නොලැබීම මත ක්‍රියාකාරී සැලසුම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.	ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	2020,2021 පැවති කොවිඩ් වසංගත තත්වයෙන් පසු බලපෑ ආරුථික අර්බුදය හේතුවෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමා කිරීම තුල මහපොළ අරමුදල මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නවතා දැමීම තුල ඉලක්ක ගත වැඩසටහන් වලට යෑමට නොහැකි විය.ඉදිරියේදී මූල්‍ය තත්වය යහපත් වූ විට ආදායම ඉහළ යාම මත මෙය ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත.
(iv) මිල්ලෑව විශ්ව විද්‍යාල ගම්මාන ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම හා	නව	පවත්නා පද්ධතිය	මෙම ව්‍යාපෘතියට අදාල ඉඩම් මැනීම් කටයුතු අවසන් කොට භුක්තිය	ක්‍රියාකාරී සැලැස්මේ	නියමිත පරිදි ව්‍යාපෘතිය ආරම්භ

ආයෝජකයින් සමඟ ගිවිසුම් ගත වීම වර්ෂය අවසාන වන විට නිම විය යුතුව තිබූ නමුත් එසේ සිදු වී නොතිබීම සහ 2021 දෙසැම්බර් 30 දින රු.340,200,000 ක් වැය කර 99 අවුරුදු බදු පදනම යටතේ ලබා ගත් ඉඩමේ කායික භුක්තිය පවරා ගැනීමේ කටයුතු ඉටු කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.		වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	භාරදීම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දිගින් දිගටම ප්‍රමාදවීම තුළ නියමිත පරිදි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවීම.	ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	කිරීමට නොහැකිවීම.
(v)මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ව්‍යාපෘතියට අදාල ඉඩම නිදහස් කිරීම සිදු නොවීම නිසා හා අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයන් අනුව ව්‍යාපෘතිය අතහැර දැමීමට භාරකාර මණ්ඩලය තීරණය කිරීම	කියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	ව්‍යාපෘතිය අතහැර දැමීමට භාරකාර මණ්ඩලය තීරණය කිරීම.
(vi) නුවරඑළිය ජෛව පද්ධති තාක්ෂණ විශ්ව විද්‍යාලය ඉදිකිරීම වෙනුවෙන් අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ව්‍යාපෘතිය සඳහා අදාල ඉඩම පවරා නොදීම හා අමාත්‍ය මණ්ඩල විසින් ගනු ලැබූ තීරණය අනුව ව්‍යාපෘතිය අතහැර දැමීමට භාරකාර මණ්ඩලය තීරණය කිරීම.	ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	ව්‍යාපෘතිය අතහැර දැමීමට භාරකාර මණ්ඩලය තීරණය කිරීම.
(vii) මංගත ලොතරැයියක් නැවත ආරම්භ කිරීම සඳහා ආයෝජකයකු තෝරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට සුදුසු ආයෝජකයකු තෝරා ගෙන ඇත. එම ආයෝජකයා සමඟ ගිවිසුම් වලට එළඹීම සඳහා භාරකාර මණ්ඩල අනුමැතිය යොමු කොට ඇත.	ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	නව මංගත ලොතරැයිය 2023 මැදභාගය වන විට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත.
(viii) විදේශ භාෂා විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	රජයේ ප්‍රතිපත්තිය අනුව නව ආයෝජන සිදු නොකළ යුතු බව දැන්වීම අනුව ව්‍යාපෘතිය අත්හිටුවන ලදී.	ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	ව්‍යාපෘතිය අත්හිටුවීමට භාරකාර මණ්ඩලය තීරණය කොට ඇත.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 16 ක් වූයෙන් තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි.එම පුරප්පාඩු අතරින්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සහ ද්විතීය මට්ටමේ තනතුරු 06 ක් පැවති අතර, එම තනතුරු වර්ෂ දෙකක සිට පුරප්පාඩුව පැවතුණි.	නව	පද්ධතිය හඳුන්වා දිය යුතුය	සියලු බඳවා ගැනීම් රජය විසින් අත්හිටුවීම තුල සේවක බඳවා ගැනීම් ප්‍රමාදවී ඇත.2023 වර්ෂයේදී අදාල බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.	අරමුදලේ අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය අවම කාර්යමණ්ඩලය හෝ බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ.	2023, 97 වෙනි භාරකාර අරමුදල විසින් සේවක අවශ්‍යතාව සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කොට අතර එහි නිර්දේශ භාරකාර මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු අදාල බඳවා ගැනීම් සිදු කරනු ඇත.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත කරන ලද අයවැය ලේඛණයේ සඳහන් රු.75,000,000 ක ආදායමක්ද, එකතුව රු.60,320,000 ක් වූ පුනරාවර්තන වියදම් අයිතම 02 ක් ද සහ එකතුව රු.284,000,000 ක් වූ මූලධන වියදම් අයිතම 07 ක් ද අරමුදල විසින් උපයෝජනය කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අදාල ව්‍යාපෘතීන් වර්ෂය තුල ක්‍රියාත්මක නොකිරීම නිසා එම ප්‍රාග්ධන වියදම් දැරීමට සිදු නොවීය. ඒ අනුව එමඟින් අපේක්ෂිත ආදායම ද ලබා ගැනීමට නොහැකි විය.	අරමුදලෙහි ආදායම් වියදම් දැරීම අයවැය ලේඛණයට අනුකූලවන පරිදි ඉටු කළ යුතු වේ.	රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ අපේක්ෂිත පරිදි නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත අපේක්ෂිත ආදායම උපයා ගැනීමට නොහැකි විය.ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය නොවීය.

මූල්‍ය ප්‍රකාශන

31 දෙසැම්බර් 2022

දෙසැම්බර් 31 දිනට	සටහන්	2022	2021
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**12**	810,946,010	841,968,416
අස්පෘශ්‍ය වත්කම්	**13**	422,219	669,280
ආයෝජන දේපළ	**14**	352,660,179	352,660,179
පරිපාලිත සමාගමේ අයෝජනය	**15**	985,000,000	985,000,000
වෙනත් ආයෝජන	**16**	2,200,000	2,200,000
මූල්‍ය වත්කම්	**17**	12,421,465,984	12,962,967,385
ජංගම නොවන මුළු වත්කම්		**14,572,694,391**	**15,145,465,260**
ජංගම වත්කම්			
වෙනත් වත්කම්	**18**	2,465,271	6,125,764
අත්තිකාරම් හා පෙරගෙවීම්	**19**	2,406,567	1,937,954
අනෙකුත් ලැබිය යුතු දෑ	**20**	1,444,206,429	377,876,221
NWSL වෙතින් ලැබිය යුතු		17,473,951	3,496,345
මුදල් හා මුදලට සමාන දෑ	**21**	64,586,566	1,926,327
මුළු ජංගම වත්කම්		**1,531,138,783**	**391,362,611**
මුළු වත්කම්		**16,103,833,176**	**15,536,827,871**
ස්කන්ධ හා බැරකම්			
සමුච්චිත අරමුදල		10,147,376,951	10,147,376,951
මූල්‍ය වත්කම් සංචිත		(1,787,093,302)	(168,796,660)
රඳවාගත් ඉපැයුම්		7,211,698,897	5,487,540,598
මුළු ස්කන්ධ		**15,571,982,546**	**15,466,120,889**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම	**22**	5,271,808	4,905,475
මුළු ජංගම නොවන බැරකම්		**5,271,808**	**4,905,475**
ජංගම බැරකම්			
උපචිතවීම් හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**23**	526,578,821	65,801,507
මුළු ජංගම බැරකම්		**526,578,821**	**65,801,507**
මුළු ස්කන්ධ හා බැරකම්		**16,103,833,176**	**15,536,827,871**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා භාරකාර මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන භාරකාර මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

අ. කළේ.
ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා
ලේකම්, වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
මහපොළ භාරකාර අරමුදලේ නිල බලයෙන් සාමාජික

අ. කළේ.
එස්.වි.ඩී.කේ. ගුණසේකර මහතා
පත්කරනු ලැබූ භාරකාර මහපොළ උසස් අධ්‍යාපන හිෂ්‍යත්ව භාර අරමුදල

අ.කළේ.
එම්.පරාක්‍රම බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ මහපොළ උසස් අධ්‍යාපන හිෂ්‍යත්ව භාර අරමුදල

වරහන් තුළ ඇති සංඛයා අඩුකිරීම් පෙන්නුම් කරයි

පිටු 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	**සටහන්**	**2022**	**2021**
ආදායම	**7**	3,178,564,254	2,412,299,900
සෘජු වියදම් (ශිෂ්‍යත්ව ගෙවීම්)	**8**	(1,366,549,835)	(1,052,955,600)
		1,812,014,420	**1,359,344,300**
වෙනත් ආදායම	**9**	472,798	534,614
මුළු ආදායම		**1,812,487,218**	**1,359,878,914**
පරිපාලන වියදම්	**10**	(65,799,943)	(67,078,075)
මූල්‍ය පිරිවැය	**11**	(71,020)	(71,025)
මුළු වියදම්		**(65,870,963)**	**(67,149,100)**
බදු පූර්ව අතිරික්තය/(හිඟය)		**1,746,616,255**	**1,292,729,814**
ආදායම් බදු වියදම්		-	-
ශුද්ධ අතිරික්තය/(හිඟය)		**1,746,616,255**	**1,292,729,814**
වෙනත් විස්තීරණ ආදායම/ (වියදම)			
වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ වටිනාකමට ණය සාධනපත්‍ර මත ශුද්ධ ලාභය/(අලාභය)	**17.1**	(1,618,296,642)	(168,796,660)
වර්ෂය සඳහා විස්තීරණ ආදායමෙන් පසුව ශුද්ධ අතිරික්තය		**128,319,613**	**1,123,933,154**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
පිටු 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)**

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	**2022**	**2021**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
ශුද්ධ අතිරික්තය/ (හිඟ)	**1,746,616,255**	**1,292,729,814**
ගැලපීම්:		
ක්ෂය වීම	31,299,967	31,589,511
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය	-	772,000
පාරිතෝෂිතය	366,333	317,630
පෙර වසර ගැලපීම්	(22,488,456)	157,863,504
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර මෙහෙයුම් අතිරික්තය	**1,755,794,099**	**1,483,272,459**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
අනෙකුත් ලැබිය යුතු දේවල වැඩි වීම/අඩුවීම	(1,077,115,933)	339,677,165
අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩි වීම/අඩුවීම	460,777,314	(244,329,921)
මෙහෙයුම් වලින් මුදල්	**(616,338,619)**	**95,347,244**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / ගලා යාම	**1,139,455,480**	**1,578,619,703**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	-	(343,921,459)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම	-	(283,306)
ස්ථාවර වත්කම් බැහැර කිරීම මගින් විකුණුම් උත්පාදන	-	-
මූල්‍ය වත්කම්වල ආයෝජන/ (ආපසු ගැනීම)	(1,076,795,241)	(1,304,552,843)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම් / (ගලා යාම).	**(1,076,795,241)**	**(1,648,757,608)**
මුදල් හා මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම/අඩුවීම	**62,660,239**	**(70,137,904)**
ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමාන දෑ	1,926,327	72,064,231
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ	**64,586,566**	**1,926,327**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
පිටු 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා

		සමුච්චිත අරමුදල	FVTOCI මූල්‍ය වත්කම් සංචිතය	රඳවාගත් ඉපැයීම්	එකතුව
2021 ජනවාරි 01 දිනට ශේෂය		**10,147,376,951**	**-**	**4,036,947,280**	**14,184,324,231**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟ)		-	-	1,292,729,814	1,292,729,814
වෙනත් විස්තීරණ ආදායම්/ (වියදම්)			(168,796,660)		(168,796,660)
පෙර වසර ගැලපීම්	**(සටහන I)**	-	-	157,863,504	157,863,504
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,147,376,951**	**(168,796,660)**	**5,487,540,598**	**15,466,120,889**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟ)		-	-	1,746,616,255	1,746,616,255
වෙනත් විස්තීරණ ආදායම්/ (වියදම්)		-	(1,618,296,642)	-	(1,618,296,642)
පෙර වසර ගැලපීම්	**(සටහන II)**	-	-	(22,457,956)	(22,457,956)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,147,376,951**	**(1,787,093,302)**	**7,211,698,897**	**15,571,982,546**

සටහන 1
පෙර වසර ගැලපීම් නියෝජනය කරන්නේ, පෙර වසරට අදාළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයේ කොටස නිවැරදි කිරීමයි.

සටහන II
පෙර වසර ගැලපීම් නියෝජනය කරන්නේ, පෙර වසරවලට අදාළ භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත වටිනාකම් නිවැරදි කිරීමයි.

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි
පිටු 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

1. ආයතනික තොරතුරු

1.1 පොදු

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (භාර අරමුදල) 1981 අංක 81 දරන පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කරන ලද භාර අරමුදලක් වන අතර භාර අරමුදලේ කළමනාකරණය හා පාලනය භාරකාර මණ්ඩලයක් වෙත පවරනු ලැබ ඇත. එය කොළඹ 7, ධර්මපාල මාවතේ අංක 191හි ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ 7 වන මහලේ පිහිටා තිබේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

වරප්‍රසාද නොලත් යෞවනයන්ට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මගින් සම අවස්ථා ඇති කිරීම.

1.1.1 මහපොළ භාර අරමුදල

අරමුදලෙහි අරමුණු සහ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය.

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම
- සතුටුදායක ලෙස තම ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර සිටින, ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට තමන්ගේ ශාස්ත්‍රීය, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයක හෝ කාර්මික නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි ඔවුන්ට ආධාර සැපයීම;
- යෞවනයන්ට තමන්ගේ වෘත්තීය නිපුණතා හා දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි, වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා කළමනාකරණය කිරීමට සහායවීම;
- අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව ඇති පාසල්, ආයතන, පදනම් සහ වෙනත් එවැනි ආයතන පිහිටුවීම සහ ඒවා කළමනාකරණය කිරීමෙහි ලා සහ පවත්වා ගෙන යාමේ ලා සහායවීම;
- අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩි දියුණු කිරීම සඳහා ආධාර සැලසීම;

1.2 නිකුත් කිරීම සඳහා බලය පැවැරූ දිනය

2023 පෙබරවාරි 07 වැනි දින භාරකාර මණ්ඩල යෝජනා සම්මතයක් ප්‍රකාරව, 2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් (LKAS) සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ඇත.

2.2 මැණිමේ පදනම

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර තිබේ.

ආයතනයේ ව්‍යවහාරික සහ ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

2.3 ප්‍රමාණාත්මාවය සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදරිපත් කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 (LKAS 01) අනුව සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

හඳුනාගත් වටිනාකම හිලව් කිරීම බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන අතර එසේ සිදුකරනු ලබන්නේ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කිරීමට සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණි. මූල්‍ය ප්‍රතිපත්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ඕනෑම ගිණුම්කරණ ප්‍රමිතියක් අරථ දැක්වීමක් මගින් නියම කර තිබේ නම් හෝ අවසර ලබා දී ඇත්නම් හෝ මිස ආදායම් ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

2.4 සංසන්දනාත්මක තොරතුරු

නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත උපයෝගී කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් කිරීමට සිදු වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර, 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' LKAS 01 ප්‍රකාරව පූර්ව මුදල් වර්ෂයේදී භාර අරමුදල විසින් යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වර්ෂයේදී ද සංගතව භාවිතා කර තිබේ. තවද, වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වනු පිණිස අවශ්‍ය තන්හිදී සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කර තිබේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයකින් දක්වා ඇත්තේ නම් මිස, මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා නිත්‍ය වශයෙන්ම උපයෝගි කර ගෙන තිබේ.

3.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1 හඳුනාගැනීමේ පදනම

සේවා සැපයීමේ සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ යන ස්පෘශ්‍ය අයිතම වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීම අපේක්ෂා කෙරේ.

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනු ලබන අතර වත්කම් සඳහා වන පිරිවැය විශ්වාසවන්තභාවයෙන් යුතුව ගණනය කළ හැකිය.

3.1.2 මැණීමේ පදනම

වත්කම් වශයෙන් හඳුනාගැනීමට සුදුසු දේපළ, පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක් මූලිකවම පිරිවැය අනුව මණිනු ලැබේ. අදාළ වත්කම් ලබාගැනීම සඳහා සෘජුවම ආරෝපණය කරනු ලබන වියදම් සහ පසුව ඒ සඳහා කොටසක් එක් කිරීමට හෝ පැරණි කොටසක් වෙනුවට නව කොටසක් එක් කිරීම සඳහා වැය වන මුදල පිරිවැය සඳහා අන්තර්ගත වේ. ස්වයං නිර්මිත වත්කම් සඳහා අමුද්‍රව්‍ය වෙනුවෙන් වැයවන පිරිවැය සහ සෘජු ශ්‍රමය, අයිතම ගෙන ඒම, ඒවා තබනු ලබන ස්ථානයේ ස්ථානගත කිරීම සහ ප්‍රාග්ධනිත ණය ගැනීමේ පිරිවැය ආදී සෘජුවම ආරෝපණය වන වෙනත් ඕනෑම ආකාරයේ පිරිවැය අන්තර්ගත වේ. මිලදී ගන්නා ලද මෘදුකාංගය අදාළ උපකරණයේ ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යාවශ්‍ය වන්නේ නම් එය පරිගණක උපකරණයේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක කොටසක් සතුව විවිධ ඵලදායී ජීව කාල පවතින විට ඒවා දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) වශයෙන් හඳුන්වනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ සඳහා භාර අරමුදල පිරිවැය ආකෘතිය යොදා ගන්නා අතර සමුච්චිත ක්ෂයවීම සහ යම් උපචිත හානිකරණ අලාභ අඩු කොට මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් මත යම් ආනුෂංගික වියදම් සමගින් ඒවායේ පිරිවැයට වාර්තා කරනු ලබයි.

3.1.3 තදනන්තර පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකි නම්, එබඳු කොටසක ප්‍රතිස්ථාපන පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයට හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ දෛනිකව සේවා කිරීම සඳහා වැය වන පිරිවැය, එය වැය වන ආකාරයට ලාභ හෝ අලාභ වශයෙන් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

3.1.4 අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු

අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා සිදුකරන ලද මූල්‍ය කාලයට අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් කරනු ලැබේ. වත්කමක හඳුනාගත් කොටසක වඩාත්ම මෑතකාලින ප්‍රතිස්ථාපනය ඉක්මවා අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හැකියාවක් පවතින විටදී ප්‍රධාන ප්‍රතිසංස්කරණයක පිරිවැය වත්කමේ ධාරණ වටිනාකමේ අන්තර්ගත කර ඇත. ආශ්‍රිත වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් ජීවිත කාලය අතරතුර ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ක්ෂය කරනු ලැබේ.

3.1.5 හඳුනාගැනීම ඉවත්කිරීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් භාවිතා කිරීම හෝ බැහර කිරීම මත අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එහි හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. වත්කමක හඳුනාගැනිම ඉවත්කිරීම මගින් ඇතිවන කිසියම් ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීම් උත්පාදන සහ ධාරණ වඩිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) වත්කමේ හඳුනාගැනීම ඉවත් කරනු ලැබූ වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ "අනෙකුත් මෙහෙයුම් වියදම්හි" හඳුනාගනු ලැබේ.

3.1.6 ක්ෂයවීම

වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව මෙම ක්‍රමවේදය මගින් පිළිබිඹු කරන බැවින් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ක්ෂයවීම හඳුනාගනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයටය.

ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි හා සවිකුරු	අවුරුදු 20
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05
පරිගණක හා උපාංග	අවුරුදු 04
මෝටර් වාහන	අවුරුදු 04

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන්හි එක් එක් විශේෂ කොටස සඳහා ක්ෂයවීමේ අනුපාතය ඒවා භාවිතය සඳහා පවතින කාලයේදී, එනම් ඒවා අදාළ ස්ථානයේ තිබෙන විට සහ කළමනාකාරිත්වය විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ඊට හැකිවන තත්ත්වයන් පවතින විටදී තීරණයකරනු ලැබේ. ක්ෂයවීමේ ක්‍රමවේද, ඵලදායී ජීවිත කාලයන් සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම නැවත තක්සේරු කොට යෝග්‍ය නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

3.1.7 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් මුලින්ම පිරිවැයට මණිනු ලැබේ. ව්‍යාපාරික සංයෝජනයක අත්කර ගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය අත්කර ගත් දිනට සාධාරණ වටිනාකම වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් යම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ යම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකොට පිරිවැයට දක්වන ලැබේ. අභ්‍යන්තරව උත්පාදිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර ආශ්‍රිත වියදම, එම වියදම දැරූ වර්ෂයේ ලාභ හෝ අලාභවල පෙන්නුම් කරනු ලැබේ.

පරිමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්

පරිමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී තිබීමට ඉඩ ඇති බවට හැඟවීමක් ඇති කවර හෝ විටදී හානිය සඳහා තක්සේරු කරනු ලැබේ. පරිමිත ජීවිත කාලයක් සහිත

අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත් පිරිසෙයින් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලයේ හෝ වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම්, උචිත පරිදි ක්‍රමක්ෂ කාල සීමාව හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් විස්තර කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. පරිමිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂ වියදම, ආදායම් ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කමේ කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයෙහි හඳුනාගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාල පහත දැක්වෙන පරිදි වේ.

අයිතමය	**ප්‍රයෝජනවත් ජීවිත කාලය**
පරිගණක මෘදුකාංග	අවුරුදු 5
වෙබ් අඩවිය	අවුරුදු 5

හඳුනාගැනීම ඉවත්කිරීම

අස්පෘශ්‍ය වත්කමක් බැහර කිරීම මත හෝ එහි භාවිතයෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එහි ධාරණ වටිනාකමේ හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක හඳුනාගැනිම ඉවත්කිරීම මගින් පැන නගින කිසියම් ලාභයක් හෝ අලාභයක් බැහැර කිරීමේ දිනට ශුද්ධ බැහැර කිරීම් උත්පාදන සහ වත්කමේ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර වත්කමේ හඳුනා ගැනීම ඉවත් කරනු ලැබූ විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

3.2 ආයෝජන දේපළ

3.2.1 හඳුනාගැනීමේ සහ මැණීමේ පදනම

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු ද්විත්වය වෙනුවෙන්ම දරා සිටින, එනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළදී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මෙම දේපළ භාණ්ඩ හා සේවා නිපදවීම හෝ සැපයුම සඳහා හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

ආයෝජන දේපළ මුල් අවස්ථාවේ දී එහි පිරිවැයට හඳුනාගනු ලැබේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ එහි පිරිවැයට සඳහන් කරනු ලැබේ.

3.2.2 හඳුනාගැනීම ඉවත්කිරීම

ආයෝජන දේපළ බැහැර කරනු ලැබූ විටදී හෝ ආයෝජන දේපළ භාවිතයෙන් ස්ථිරවම ඉවත් කරනු ලැබ එය බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විටදී ඒවායේ හඳුනා ගැනිම ඉවත් කරනු ලැබේ. ආයෝජන දේපළක ඉවත් කිරීම හෝ බැහැර කිරීම මත යම් ලාභ හෝ අලාභ එසේ ඉවත් කරනු ලැබූ හෝ බැහැර කරනු ලැබූ වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

3.2.3 ආයෝජන දේපළට/ දේපළෙන් තදනන්තර පැවැරුම

හිමිකරු භුක්ති විඳීම අවසන් වීම, වෙනත් පාර්ශවයකට මෙහෙයුම් කල් බද්දක් ආරම්භ කිරීම හෝ ඉදි කිරීම හෝ සංවර්ධනය නිමා කිරීම මගින් සාක්ෂි දරන භාවිතයේ වෙනස්කමක් සිදු වන විටදීම පමණක් ආයෝජන දේපළට පැවැරුම් සිදු කරනු ලැබේ.

හිමිකරු භුක්ති විඳීම අවසන් වීම හෝ විකිණීමට අදහස් කර ගනිමින් සංවර්ධනය කිරීම ආරම්භ කිරීම මගින් සාක්ෂි දරන භාවිතයේ වෙනස්කමක් සිදු වන විටදීම පමණක් ආයෝජන දේපළට පැවැරුම් සිදු කරනු ලැබේ.

ආයෝජන දේපළකින් හිමිකරු පදිංචිගත දේපළකට හෝ තොගයකට පැවරුමක් සඳහා, පසුකාලීන ගිණුම්කරණය සඳහා දේපළේ හඹින පිරිවැය වනුයේ භාවිතයෙහි වෙනස්වීමක් සිදුවූ දිනයේ එහි සාධාරණ අගය වේ. හිමිකරු විසින් පදිංචිගත දේපළක් ආකාරයෙන් දේපළ සමාගම විසින් පරිහරණය කරන්නේ නම් එය ආයෝජන දේපළක් වන අතර, එහි භාවිතයේ වෙනසක් සිදුවන දිනය දක්වාම දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව එකී දේපළ සමාගම වගකිව යුතු වේ.

තොගයක් ආයෝජන දේපළක් බවට මාරු කිරීමේ දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඉදි කරන ලද අයෝජන දේපළක ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම සමාගම විසින් නිමකරනු ලබන විටදී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

3.2.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම කිසියම් වත්කමක් හානි වීමේ ඇඟවීමක් ඇත්දැයි නිශ්චිතව දැන ගැනීම සඳහා සමාගම විසින් ඇස්මේන්තු කරනු ලැබේ. එවැනි හානිකරණ ඇඟවීම් පවතින විට හෝ වත්කම් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට භාර අරමුදල වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ආපසු අයකර ගහ හැකි අගය යනු වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිබාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්. අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්කමට විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩු කොට සාධාරණ වටිනාකම නිර්ණය කිරීමේදී , පවතින්නේ නම්, මෑත කාලීන වෙළඳපොළ ගනුදෙනු සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම්, උචිත තක්සේරු කිරීමේ ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

3.3 පරිපාලිතයන්හි ආයෝජන හා අනෙකුත් ආයෝජන

පරිපාලිතයන්හි සිදුකරන ආයෝජන හා අනෙකුත් ආයෝජන මුල් අවස්ථාවේදී සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දී පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. පරිපාලිතයන් අත්පත් කරගැනීමට අදාළ යම් ගනුදෙනු පිරිවැයක් එම අවස්ථාවේදීම ආදායම් ප්‍රකාශනයේ හඳුනාගන්නා අතර, පරිපාලිතයන්හි සිදුකරන ආයෝජන මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව යම් සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු පිරිවැය මත දක්වනු ලැබේ.

3.4 විදේශ ව්‍යවහාර මුදල්

අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

අදාළ අස්ථිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදල භාවිතා කොට මූල්‍ය ප්‍රකාශනවල අඩංගු අයිතම මිනිනු ලැබේ. (කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල). සමාගමේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

ආ) ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ඒකකවලින් සිදුවන ගනුදෙනු, අදාළ ගනුදෙනු සිදුවන දිනයන්හි දී බල පැවැත්වෙන විනිමය අනුපාතිකයන් භාවිතයෙන් ව්‍යවහාරික මුදල් ඒකකය වෙත පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමේදී සහ විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් සිදුකරන මුදල් වත්කම් හා බැරකම් ගනුදෙනුවල දී ප්‍රතිඵල වන විදේශ විනිමය ලාභ සහ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. මුදල් වත්කම් හා බැරකම් ශේෂ වසර අවසාන විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කරනු ලැබේ.

3.5 බදුකරණය

3.5.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන හා පූර්ව කාල පරිච්ඡේද සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලබන්නේ ආදායම් බදු කොමසාරිස්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් ප්‍රමාණ වශයෙනි. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැනෙනුයේ වාර්තාකරණ දිනයට පෙර සිට බල පැවැත්වූ හෝ එම දිනයට බල පැවැත්වෙන පරිදි පනවා ඇති බදු අනුපාතික හා බදු නීති වේ.

මෙම භාර අරමුදල සඳහා ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම පහත පරිදි වේ.

අ) මහපොළ භාර අරමුදල

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ආදායම් බදු සඳහා යටත් වන අතර අවසන් බද්ද ගණනය කරනු ලබන්නේ කාල සීමාව සඳහා ශුද්ධ ආදායම සහ අනුදත් වියදම් ලෙස සලකනු ලබන සියලු වියදම් මත වන අතර අනතුරුව බදු ගණනය කිරීම මත අවසන් ආදායම නිර්ණය කිරීම සඳහා එළඹෙනු ලැබේ.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආදායම් බදු පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - ප්‍රතිපත්තිමය කරුණු

1981 අංක 6 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ 12 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි තීරු බදු, ආනයන බදු ආදායම් බදු, තෑගි බදු සහ රඳවාගැනීමේ බදු ඇතුළුව සියලුම බදුවලින් නිදහස් වීම පිණිස 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 වැනි වගන්තියේ තුන්වන උපලේඛනයට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ඇතුලත් කිරීම සඳහා උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නව්‍යකරණ අමාත්‍යවරයා විසින් 31.12.2019 දිනැතිව ඉදිරිපත් කරන ලද සංදේශයක් වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/0144/215/010 - මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමන්ගේ නිරීක්ෂණ සමගින් ඉහත සංදේශය සලකා බලන ලදී. සාකච්ඡාවලින් පසුව, දල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග එක්ව සංදේශයේ දක්වා ඇති කාර්යය සඳහා මිළඟ අයවැයට යෝජනාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව විමසා බලන ලෙස උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නව්‍යකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කිරීමට සහ ඒ අනුව ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලදී.

3.5.2 විලම්භිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් පිළිගනු ලැබේ.

සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම ප්‍රයෝජනයට ගත හැකි බදු අයකළ හැකි ලාභයක් තිබීමේ හැකියාව ඇති ප්‍රමාණයට සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලැබේ.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන දේ වලට අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු ලෙස රඳවාගෙන ඇති තැන්පතු ,මුලින් මාස තුනක කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුලත් වේ .බැංකු අයිරා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් තුළ පෙන්නුම් කරනු ලැබේ.

4. මූල්‍ය සාධනපත්‍ර - මූලික පිළිගැනීම සහ තදනන්තර මැණීම

4.1 මූල්‍ය වත්කම්

4.1.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මැණීම

2018 ජනවාරි 1 වනදා සිට ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව, භාර අරමුදල වත්කම් කළමනාකරණය සඳහා ව්‍යාපාර ආකෘතිය මත පදනම්ව තම සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන අතර වත්කමේ ගිවිසුම්කර නියමයන්;

- ක්‍රමක්ෂිත පිරිවැයට හෝ
- වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට (FVOCI) හෝ

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට (FVTPL) මනිනු ලැබේ.

මූල්‍ය වත්කම් තදනන්තරව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

4.1.2 ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්

ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව, මූල්‍ය වත්කමක් පහත දැක්වෙන දෙයාකාර කොන්දේසි සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම ලෙස නිර්දිෂ්ඨ කර නොමැති නම්, ඒවා ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබයි.

- ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස වත්කම් රඳවා ගැනීම අරමුණ වන්නා වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවා ගැනීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්කර කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හිදී තනිකරම නොපියවා ඇති මුල් මුදල සහ එම මුල් මුදල මත පෙළිය ගෙවීම් වන මුදල් ප්‍රවාහ උද්ගත කරවීම

4.1.3 වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම්

වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් වෙනත් විස්තීරණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය සහ ස්කන්ධ සාධනපත්‍රවලින් සමන්විත වේ.

ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව, මෙය වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ වටිනාකමට මනින ලද ණය සාධනපත්‍ර සහ වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ වටිනාකම අනුව නිර්දිෂ්ට කරන ලද ස්කන්ධ සාධනපත්‍රවලින් සමන්විත වේ.

4.1.4 වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට අනුව මනින ලද ණය සාධනපත්‍ර

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන දෙයාකාර කොන්දේසි සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙස නිර්දිෂ්ඨ කර නොමැති නම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙස නිර්දිෂ්ඨ කර නොමැති නම් පමණක් ණය සාධනපත්‍රයක් වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගය අනුව මනිනු ලබයි.

- ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස වත්කම් රඳවා ගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණ සපුරා ගන්නා වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවා ගනු ලැබීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්කර කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හිදී තනිකරම නොපියවා ඇති මුල් මුදල සහ එම මුල් මුදල මත පෙළිය ගෙවීම් වන මුදල් ප්‍රවාහ උද්ගත කරවීම

අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගනු ලබන සාධාරණ අගයේ වෙනස්කම් හේතුවෙන් පැන නගින ලාබ හෝ අලාබ සමගින් වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගය ණය සාධනපත්‍ර පසුව සාධාරණ අගයට මනිනු ලැබේ. පොලී ආදායස සහ අපේක්ෂිත ණය අලාභ සහ ප්‍රතිවර්තන ලාභ අලාභ තුල හඳුනා ගැනේ. පෙර වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභ හෝ අලාභ හඳුනාගැනීම් ඉවත් කිරීමේදී, වෙනත් විස්තීරණ ආදායම්වලින් ලාභ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරේ. මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර තිබූ රජයේ සුරකුම්පත්වලින් මෙම සාධනපත්‍ර සමන්විත වේ.

4.1.5 වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ සාධනපත්‍ර

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 32 හි " මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම" යටතේ ස්කන්ධය යන්නෙහි අර්ථ දැක්වීමට අනුකූල වන සහ වෙළඳාම සඳහා රඳවා නොගත් ස්කන්ධ සාධනපත්‍රවලින් ක්‍රමෝපායික කාර්යය සඳහා රඳවාගත් ස්කන්ධ ආයෝජනවලින් කොටසක් මුල් හඳුනාගැනීමෙන් පසු, වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය සාධනපත්‍ර ලෙස අවලංගු කර ගත නොහැකි පරිදි වර්ගීකරණය කිරීමට සමාගම විසින් ඇතැම් විට තීරණය කරනු ලැබේ. එවැනි වර්ගීකරණයක් සාධන පත්‍රයෙන් සාධන පත්‍රයට යන පදනම මත නිගමනය වේ.

මෙම ස්කන්ධ සාධනපත්‍රවල ලාභ සහ අලාභ කිසිදු විටක ලාභ හෝ අලාභ යටතට ප්‍රතිවක්‍රකරණය නොවන අතර, ඒ වෙනුවට එකී හඳුනාගැනීම් ඉවත් කරන අවස්ථාවේදී රඳවාගත් ඉපැයුම් වෙත සෘජුවම මාරු කෙරේ. ගෙවීම් වෙත අයිතිය ස්ථාපනය වූ පසු, ලාභාංශ ලාභ හෝ අලාභ ලෙස අනෙකතු මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වන ණය සාධනපත්‍ර භානිකරණ පරීක්ෂාවට භාජනය නොවේ.

මින් පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි "විකිණීම සඳහා පවතින" යටතේ වර්ගීකරණය වූ මිල සඳහන් නොකළ හිමිකම් කොටස්වලින් මෙම උපකරණ සමන්විත වේ.

4.1.6 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මනින ලද මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 අනුව, ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වර්ගීකරණය වූ මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්නම් ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීම සඳහා රඳවා ගත් හෝ කළමනාකරණය කරන හා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා දරා නොසිටින මෙන්ම මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම යන කාර්ය ද්විත්වය වෙනුවෙන්ම දරා නොසිටින බැවින් එහි කාර්යසාධනය සාධාරණ අගය මත පදනම්ව ඇගයීම සිදුවන මූල්‍ය වත්කම් ද සහ මුල් හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ද ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 අනුව විකිණීම සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම්ය.

4.2 මූල්‍ය බැරකම්

4.2.1 මූල්‍ය බැරකම් වර්ගීකරණය හා පසුකාලීන මැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 අනුව, මූල්‍ය බැරකම් පහත ආකාරයෙන් වර්ගීකරණය කෙරේ.

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්, සහ
- වෙළඳාම සඳහා රඳවාගත් හෝ
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද වශයෙන් මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය වේ.
- ක්‍රමක්ෂය පිරිවැය අනුව මනින ලද මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම්වල පසුකාලීන මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාරණ ප්‍රමිත (SLFRS 9) මගින් මූල්‍ය බැරකම් වර්ගීකරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 39) හි පවතින අවශ්‍යතා බොහෝ සෙයින් රඳවා ගෙන ඇත.

4.2.2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධරණ අගය අනුව මූල්ය බැරකම්

වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය බැරකම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මුල් හඳුනාගැනීමෙන් අනතුරුව නම් කරන ලද මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම් යටතට ඇතුළත් වේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් නොකරනු ලබ මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කෙරේ.

4.3 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකමම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

4.3.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහය වෙත ගිවිසුම්කර අයිතීන් අවසන් වන විට හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරානුකූලව පවරනු ලබන ගනුදෙනුවකින් ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය එය පවරනු ලබන විටදී හෝ නැතහොත් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරනුකූලව රඳවා ගැනීම පැවැරීම සමාගම සිදු නොකරන විටදී සහ මූල්‍ය වත්කමේ පාලනය එය රඳවා නොගන්නා විටදී සමාගම මූල්‍ය වත්කමක (හෝ අදාළ වන අවස්ථාවන්හිදී මූල්‍යමය වත්කමක කොටසක) හඳුනාගැනීම ඉවත් කරයි.

වත්කමෙහි ධාරණ අගය (හෝ වත්කමෙහි හඳුනාගැනීම ඉවත් කරන කොටසට අදාළ වන ධාරණ අගය) හා ලැබී ඇති ප්‍රතිශ්ඨාවල එකතුව (අලුතින් එක් කරගත් නව වත්කම්වලින් අලුතින් භාර ගන්නා බැරකම් අඩුකර එය ද ඇතුළුව) අතර වෙනස සහ වෙනත් විස්තීරණ ආදායම්හි දී හඳුනා ගන්නා යම් සමුච්චිත ලාභ/අලාභ, මූල්‍ය වත්කමක හඳුනා ගැනීම ඉවත් කිරීමේ දී ලාභ හෝ අලාභවලදී හඳුනා ගැනේ. එසේ වුවද, වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ස්කන්ධ ආයෝජන සුරැකුම්වලට අදාළව හඳුනාගත් සමුච්චිත ලාභ/අලාභ, ශ්‍රීලමූවාප්‍ර 9 ප්‍රකාරව හඳුනාගැනීම ඉවත් කිරීමේදී ලාභ හෝ අලාභවල හඳුනා ගනු නොලැබේ.

සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවා ගෙන සිටින, හඳුනාගැනීම ඉවත් කිරීම සඳහා සුදුසුකම් ලැබූ පැවැරූ මූල්‍ය වත්කමකට අදාළ කවර හෝ හිමිකමක් ඇතොත් එය වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබන වත්කම් පැවැරීම සඳහා සමාගම ගනුදෙනුවලට එළඹීම සිදු කරන නමුත් පවරනු ලබන වත්කම් හෝ එහි කොටසක සියලු හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීම සිදු කරයි. එවැනි අවස්ථාවන්හි දී, පවරනු ලබන වත්කම්වල හඳුනා ගැනීම ඉවත් නොකරනු ලැබේ.

පවරනු ලබන වත්කම් මත සමගාමී මුළු අවදානම් අනුපාතිකය සහිතව වත්කම් තෙවන පාර්ශවයකට විකිණීමේදී, එය අලෙවි හා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවක් හා සමානව සුරැකුම් කරන ලද මූල්‍යමය ගනුදෙනුවක් ලෙස ගිණුම් ගත කෙරේ. එයට හේතුව වනුයේ සමාගම විසි් එකී වත්කම්වල හිමිකාරිත්වයේ සියලුම හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීමයි.

සමාගම විසින් වත්කමකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති සිය අයිතිය පැවැරූ විට හෝ පැවරීමේ විධිවිධානයකට එළඹී සිටීම සහ වත්කමක සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ පැවරීමක් හෝ රඳවා ගැනීමක් හෝ සිදුකර නොමැති හෝ වත්කම් පාලනය කිරීම පවරා නොමැති විටක, වත්කම සම්බන්ධයෙන් සමාගමේ අඛණ්ඩ සම්බන්ධතාවය පවතින සීමාව දක්වා එම වත්කම හඳුනා ගැනීම සිදු කෙරේ. එම අවස්ථාවේදී සමාගම විසින් ආශ්‍රිත බැරකම් හඳුනාගනු ලැබේ. සමාගම විසින් රඳවාගනු ලබන අයිතීන් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවැරූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මැනීම සිදු කරනු ලැබේ.

4.3.2 මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකමක ගිවිසුම්කර බැඳීම් ඉටු කළ විටදී හෝ අවලංගු කළ විටදී හෝ කල් ඉකුත් වූ විටදී සමාගම එහි හඳුනා ගැනීම ඉවත් කරයි.

4.3.3 මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම

හඳුනාගත් මුදල් ප්‍රමාණ හිලව් කිරීමට වත්මනෙහි බලාත්මක කළ හැකි නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමකින් බේරුම් කිරීමට අභිප්‍රායක් හෝ වත්කම් ලබා ගැනීමට සහ එකවර වගකීම් බේරුම් කිරීමට අභිප්‍රායක් ඇත්නම් පමණක්ම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කොට ශුද්ධ මුදල මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කෙරෙනුයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මගින් අවසර ලැබෙන අවස්ථාවනිහිදි පමණක් හෝ සමාගමේ වෙළඳ කටයුතු වැනි සමාන ආකාරයේ ගනුදෙනු සමූහයකින් ප්‍රතිඵල වන ලාභ හා අලාභ සඳහා පමණි.

5. බැරකම් ප්‍රතිපාදන

5.1 බැරකම්

5.1.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

5.1.1.1 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයන් සඳහා පළමු වසරේ සිටම ක්‍රියාත්මක වන විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ, සේවකයකු සඳහා වගකීමක් ඇති වනුයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් අනතුරුව වේ. මෙම වගකීම ගණනය කරනුයේ සෑම වර්ෂයක් සඳහා මාසයක වැටුපෙන් අර්ධයක අනුපාතිකය මත වේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ බැරකම් යටතේ දැක්වේ.

මෙම පාරිතෝෂික බැරකම් වෙනුවෙන් බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.1.1.2 නිර්වචිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

මහපොළ භාර අරමුදල විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත දරණ දායකත්වයන් අදාළ නීති රීතිවලට අනුකූලව අදාළ දායකත්ව ප්‍රතිපාදන මගින් ආවරණය වේ. සේවකයක් ආවරණය කරමින් දායකත්ව සැලසුම් වෙත දායක මුදල් ගෙවීමට ඇති බැඳීම් ආදායම් ප්‍රකාශනයේ වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

භාර අරමුදල හා සේවකයන් පිළිවෙළින් දළ වැටුපෙන් 15% සහ 10% ක් අර්ථසාධක අරමුදල දායක කරයි.

සේවක භාරකාර අරමුදල

භාරකාර අරමුදල සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක කරයි.

5.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික සහ සම්මුතික බැඳීමක් භාර අරමුදල සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඇතැම් හෝ සියලු ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමක් අපේක්ෂා කරන විටදී, නිදසුනක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ නම්, ප්‍රතිපූරණය වෙනම වත්කමක් යටතේ හඳුනාගන්නා අතර නමුත් එසේ කරනුයේ ප්‍රතිපූරණය සත්‍ය වශයෙන්ම ස්ථිර නම් පමණකි. කවර ආකාරයක හෝ ප්‍රතිපාදනයක් හා සබැඳි වියදම්, යම් ප්‍රතිපූරණයක් තිබේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කෙරේ.

මුදලේ කාලික අගයේ බලපෑම ප්‍රමාණාත්මක නම්, බැරකම් සඳහා නිශ්චිත වන අවදානම් අදාළ පරිදි පෙන්නුම් කෙරෙන ප්‍රවර්තන පෙර බදු අනුපාතිකය භාවිතයෙන් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් කිරීම යොදා ගනු ලබන විට කාලය ගත වීමට අනුව සිදුවන ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය පිරිවැයක් වශයෙන් හඳුනා ගැනේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනා ගැනීම

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මගින්, ආදායම සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 (LKAS 18) හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 (LKAS 11) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ විවරණ කමිටුවේ පාරිභෝගික ලැදියාව සම්බන්ධ IFRIC 13 ද ඇතුළුව ආදායම් හඳුනා ගැනීම් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කර ඇත..

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මගින් ආදයම හඳුනාගනු ලබන්නේ කෙසේද හා කොපමණ වශයෙන් කවර දිනයකට ද යන්න නිර්ණය කිරීම සඳහා සම්පූර්ණ ආකෘති රාමුවක් සපයනු ලැබේ. ආදායම හඳුනාගනු ලබන්නේ කවර දිනයකට ද හා කවර අගයකින් ද යන්න නිර්ණය කිරීම සඳහා අස්තිත්වය විසින් පියවර පහකින් යුතු ආකෘතියක් යොදා ගැනීම අවශ්‍ය වේ. ආදායම හඳුනා ගන්නේ කවර දිනයක ද හෝ අස්තිත්වය සඳහා අපේක්ෂා කරන හිමිකාරිත්වය යටතේ කුමන අගයකින් පාරිභෝගිකයා වෙත භාණ්ඩ හා සේවාවල පාලනය පවරා දීම යන්න සහ භාරකාර අරමුදල වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම අපෙක්ෂා කළ හැක්කේ කවර දිනයක දී යන්න හා ගෙවීම් කරන දිනය කුමක් වුවද ආදායම හා දරණ ලද හෝ දැරිය යුතු ආශ්‍රිත වියදම් විශ්වසනීය ආකාරයකින් මිනුම්කරණය මෙම ආකෘතිය මගින් නිශ්චය කෙරේ. ගිවිසුම් ප්‍රකාරව නිර්වචිත ගෙවීම් නියම සැලකිල්ලට ගනිමින්, ලැබී ඇති හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවන්හි සාධාරණ අගයට ආදායම මනිනු ලැබේ.

6.1.1 පොළී ආදායම

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන සියලු මූල්‍ය සාධනපත්‍ර සහ විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කරන ලද පොළී දරන මූල්‍ය වත්කම් සඳහා පොළී ආදායම හෝ වියදම් සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ. සඵල පොළී අනුපාතිකය යනු මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාල හෝ කෙටි කාල සීමාවක් ඔස්සේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම හෝ ලැබීම අනුව තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලැබූ අනුපාතිකයයි. ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම තුළ පොළී ආදායම ඇතුළත් වේ.

6.1.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

6.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමට වැය කෙරෙන සියලු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමෙන් අයකරනු ලැබේ. අලුත් වැඩියා කිරීම් හා අලුත් කිරීම්වලට අදාළ වියදම් දරනු ලැබූ වර්ෂයට අදාළ ලාභ හා අලාභවලින් අය කරනු ලැබේ.

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2022	2021
7 ආදායම			
ශුද්ධ පොලී ආදායම	**7.1**	1,771,795,864	1,157,299,900
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයේ කොටස		1,381,768,390	1,230,000,000
SLIIT වෙතින් ලද කල්බදු කුලිය		25,000,000	25,000,000
		3,178,564,254	**2,412,299,900**

7.1 මහපොළ භාරකාර අරමුදල ආයෝජන ආදායම			
භාණ්ඩාගාර බැඳුම්කර - කූපනය	**සටහන 7.2**	726,704,479	676,572,164
ලාභ		-	-
භාණ්ඩාගාර බිල්පත් - පොලී	**සටහන 7.3**	628,929,539	-
ණයකර පොලී		110,793,893	161,279,088
රඳවාගැනීමේ බද්ද අඩුකොට ස්ථාවර තැන්පතු		272,130,181	309,751,558
REPO ආදායම		5,439,284	3,711,191
කෙටිකාලීන ආදායම		27,418,223	5,862,119
ස්වීපර් ආදායම		380,263	123,779
		1,771,795,864	**1,157,299,900**

7.2 භාණ්ඩාගාර බැඳුම්කර කූපනය		
භාණ්ඩාගාර බැඳුම්කර - කූපනය	726,704,479	676,572,164
	726,704,479	**676,572,164**

7.3 භාණ්ඩාගාර බිල්පත් - පොලී

වර්ෂය තුළ ලැබුණු පොලිය	60,687,700	-
වර්ෂයේදී ලැබිය යුතු පොළිය	659,965,785	-
මුළු පොලී ආදායම	720,653,485	-
අඩු කළා		
NWSL හි භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම	(91,723,946)	-
MTF හි භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම	**628,929,539**	**-**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2022	2021
8 සෘජු වියදම්			
ශිෂ්‍යත්ව ගෙවීම්			
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල	**(සටහන 8.1)**	1,288,347,209	984,512,850
ශිෂ්‍යත්ව ගෙවීම් -තාක්ෂණ විද්‍යාල		59,930,000	61,581,500
ශිෂ්‍යත්ව ගෙවීම් - අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන		17,866,350	6,861,250
නව ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම්		406,276	-
		1,366,549,835	**1,052,955,600**
8.1 ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල			
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල		2,677,047,059	1,830,436,600
අඩුකළා : භාණ්ඩාගාර දායකත්වය (ප්‍රතිපාදන කොමිසම හරහා)		(1,388,699,850)	(845,923,750)
		1,288,347,209	**984,512,850**
9 වෙනත් ආදායම්			
කාර්ය මණ්ඩල ණය පොලී		65,065	54,744
පරිත්‍යාග		-	365,550
ශිෂ්‍යත්ව අඩු කිරීම		98,350	27,000
විවිධ ආදායම්		38,000	87,320
වෙනත් ආදායම්		143,735	-
පාරිතෝෂික FD ආදායම		127,649	-
		472,798	**534,614**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022	2021
10 පරිපාලන වියදම්		
වැටුප්	12,871,814	12,448,631
පැමිණීම සහ සන්නිවේදන දීමනාව	1,566,500	1,184,000
අතිකාල සහ සති අන්ත ගෙවීම්	245,314	583,285
සේ.අ.අ.	1,471,291	1,174,779
සේ.භා.අ.	297,693	255,561
ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් හා කාර්ය මණ්ඩල දිරි දීමනා	411,081	147,767
ක්ෂය කිරීම	31,052,906	31,369,306
ක්‍රමක්ෂය	247,061	220,205
තැපැල් ගාස්තු සහ සන්නිවේදනය	37,615	39,540
පාරිතෝෂිතය	-	321,961
සුභසාධන වියදම්	238,972	215,602
දුරකථන	647,612	804,320
විගණන ගාස්තු	396,000	300,000
පරිවර්ථන මහ අනෙකුත් සේවා ගාස්තු	122,765	539,130
භාරකාර මණ්ඩල සහ ආයෝජන රැස්වීම් ගාස්තු	275,000	362,500
ඉන්ධන, ගමන් කිරීම සහ යැපීම	467,157	1,803,219
ජල	36,320	12,358
විදුලිබල	534,232	496,017
පිරිසිදු කිරීමේ වියදම්	51,400	46,500
සංග්‍රහ වියදම්	47,881	64,033
ආරක්ෂක ගාස්තු	4,320	272,160
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	784,815	1,860,663
නඩත්තු වියදම් - කාර්යාල උපකරණ	1,674,382	369,241
කාර්යාල කුලිය -ජේ.ආර්.ජයවර්ධන	3,623,400	3,623,400
පද්ධති නඩත්තු සහ තොරතුරු තාක්ෂණ වියදම්	210,288	190,950
පරිත්‍යාග -ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය	1,775,000	10,000
රක්ෂණ - කාර්ය මණ්ඩල	325,000	323,151
වෙළඳ දැන්වීම් වියදම්	663,093	1,927,784
නීති ගාස්තු	469,359	194,309
දායක ගාස්තු	83,060	24,590
විවිධ වියදම්	64,700	90,805
වෙබ් අඩවි සංවර්ධන පිරිවැය	-	-
වාහන කුලියට දීම	1,262,283	1,717,200
වාහන නඩත්තුව	939,314	477,317
භාරකාර ගාස්තු -ලංකා බැංකු ආයෝජන බැංකුකරණය	2,689,692	2,592,000
වෘත්තීය ගාස්තු	187,484	-
සෞඛ්‍ය සේවා සහ ආරක්ෂිත වියදම්	25,140	265,794
ව්‍යාපෘතිය - මිහින්තලේ	-	750,000
	65,799,943	**67,078,075**
11 මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	71,020	71,025
ණය පොලී	-	-
	71,020	**71,025**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

12 දේපළ, පිරියත හා උපකරණ

දළ ධාරණ මුදල් ප්‍රමාණ	2022.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්	2022.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	1,064,520,695	-	-	1,064,520,695
ගෘහ භාණ්ඩ සහ උපාංග	8,406,812	-	-	8,483,312
කාර්යාල උපකරණ	3,949,935	-	-	3,898,935
පරිගණක උපාංග	7,313,830	-	-	7,318,830
මෝටර් වාහන	16,190,000	-	-	16,190,000
ක්ෂය කළ හැකි වත්කම්වල මුළු වටිනාකම	**1,100,381,272**			**1,100,411,772**

සමුච්චිත ක්ෂයකිරීම් හා හානිකරණය	2022.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	බැහැර කිරීම්	2022.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	233,043,720	26,613,017	-	259,656,737
ගෘහ භාණ්ඩ සහ උපාංග	7,999,192	92,213	-	8,091,405
කාර්යාල උපකරණ	1,856,520	522,970	-	2,379,490
පරිගණක උපාංග	6,668,804	586,706	-	7,255,510
මෝටර් වාහන	8,844,619	3,238,000	-	12,082,619
මුළු ක්ෂයකිරීම්	**258,412,856**	**31,052,906**	**-**	**289,465,762**

ශුද්ධ පොත් වටිනාකම	2021.12.31 දිනට ශේෂය	2022.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	831,476,975	804,863,958
ගෘහ භාණ්ඩ සහ උපාංග	407,620	391,907
කාර්යාල උපකරණ	2,093,415	1,519,445
පරිගණක උපාංග	645,026	63,320
මෝටර් වාහන	7,345,381	4,107,381
දේපළ, පිරියත හා උපකරණවල මුළු ධාරණ වටිනාකම	**841,968,416**	**810,946,010**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා

13 අස්පෘශ්‍ය වත්කම්

දළ ධාරණ මුදල	2022.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්	2022.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	177,000	-	-	177,000
මහපොළ වෙබ් අඩවිය	775,000	-	-	775,000
MS Office -2019	283,306	-	-	283,306
ක්ෂය කළ හැකි වත්කම්වල මුළු වටිනාකම	**1,235,306**	**-**	**-**	**1,235,306**

සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණය	2022.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	බැහැර කිරීම්	2022.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	105,618	35,400	-	141,018
මහපොළ වෙබ් අඩවිය	430,602	155,000	-	585,602
MS Office -2019	29,805	56,661	-	86,466
සම්පූර්ණ ක්ෂයවීම්	**566,025**	**247,061**	**-**	**813,086**

ශුද්ධ පොත් අගයන්	2021.12.31 දිනට ශේෂය	2022.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	71,382	35,982
මහපොළ වෙබ් අඩවිය	344,398	189,398
MS Office -2019	253,501	196,839
අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ වටිනාකම	**669,280**	**422,219**

14 ආයෝජන දේපල	**2022**	**2021**
සින්නක්කර ඉඩම (මාලබේ - SLIIT වෙත බදු දී ඇත)	12,460,179	12,460,179
බදුකරඉඩම (මිල්ලැව)	340,200,000	340,200,000
	352,660,179	**352,660,179**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2022	2021
15 පරිපාලිත සමාගම්වල ආයෝජනය			
නැවිවෙල්ත් සමාගම *		985,000,000	985,000,000
		985,000,000	**985,000,000**

* නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස පිහිටුවා ඇත

16 වෙනෑ වෙනත් ආයෝජන			
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රාග්ධන ආයෝජනය		2,200,000	2,200,000
		2,200,000	**2,200,000**
17 මූල්‍ය වත්කම්			
FVTOCI හි මූල්‍ය වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර	**සටහන**	6,208,728,828	7,992,639,179
භාණ්ඩාගාර බැඳුම්කර වාරික සහ වට්ටම්		-	-
මූල්‍ය වත්කම් ප්‍රතික්ෂේප කළ පිරිවැයට			
භාණ්ඩාගාර බිල්පත්		5,336,408,950	-
ණයකර		375,000,000	1,075,000,000
ස්ථාවර තැන්පතු		500,000,000	3,760,000,000
FVPL මූල්‍ය වත්කම්			
REPO		-	134,000,000
BOC- ස්විපර් ගිණුම -4079		1,328,206	1,328,206
		12,421,465,984	**12,962,967,385**

17.1 භාණ්ඩාගාර බැඳුම්කර		
දෙසැම්බර් 31 වන විට ශේෂය	**7,992,639,179**	**8,161,435,839**
වසර තුළ එකතු කිරීම්	477,536,000	-
වර්ෂය තුළ හඳුනාගෙන ඇත පොළිය	726,704,479	-
වසර තුළ වෙළඳාම	(517,417,000)	-
කුපනය ලැබීම්	(795,550,286)	-
පෙර වසර තුළදී විකුණන ලද බැඳුම්කර සඳහා ගැලපීම	(56,886,902)	-
	7,827,025,470	**8,161,435,839**
විකුණන ලද ණය වලට අදාළ සාධාරණ වටිනාකම් වෙනස්වීම්:	(2,661,815)	-
වසර තුළ සාධාරණ වටිනාකම් වෙනස්වීම්	(1,615,634,827)	(168,796,660)
වසර තුළ සාධාරණ වටිනාකම් වෙනස්වීම් සාධාරණ තක්සේරුවේදී ණය උපකරණවල ශුද්ධ ලාභය/ (පාඩුව)	**(1,618,296,642)**	**(168,796,660)**
දෙසැම්බර් 31 වන විට සාධාරණ වටිනාකම	**6,208,728,828**	**7,992,639,179**

18 වෙනත් වත්කම්		
විශ්‍රාම ප්‍රතිලාභ වත්කම් (ස්ථාවර තැන්පතු)	-	3,685,913
ලිපි ද්‍රව්‍ය තොගය	304,761	279,341
කුලී තැන්පතු ජයවර්ධන මධ්‍යස්ථානය	1,811,700	1,811,700
සතොස කුලී තැන්පතු	348,810	348,810
	2,465,271	**6,125,764**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022	2021
19 අත්තිකාරම් සහ පෙරගෙවුම්		
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	1,845,504	1,477,096
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	306,000	399,000
පෙරගෙවුම් වෛද්‍ය රක්ෂණය	61,858	61,858
Generator සවි කිරීම සඳහා පෙරගෙවුම්	193,204	-
	2,406,567	**1,937,954**
20 අනෙකුත් ලැබිය යුතු දෑ		
වි.ප්‍ර.කො.සභාවෙන් ලැබිය යුතු මුදල් (භාණ්ඩාගාර දායකත්වය)	429,337,500	49,807,900
ස.ලො.මණ්ඩලයේ ලාභ කොටස් ලැබිය යුතු මුදල්	266,790,550	219,503,210
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී	62,089,041	64,887,973
ණයකර පොලී ලැබිය යුතු දේ	24,854,075	42,799,052
පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොලී ලැබිය යුතු මුදල්	71,194	71,194
T- බිල්පත් පොලී ලැබිය යුතු - MTF	568,241,839	-
T- බිල්පත් පොලී ලැබිය යුතු - NWSL	91,723,946	-
ශිෂ්‍යත්ව ගෙවීම් ලැබිය යුතු මුදල්	25,000	25,000
ලැබිය යුතු මුදල් -වෙළඳ අමාත්‍යාංශය	1,021,450	772,000
	1,444,154,595	**377,866,328**
වාහන රක්ෂණ ලැබිය යුතු මුදල්	40,038	-
ලැබිය යුතු රක්ෂණ වාරික	11,795	9,893
	1,444,206,429	**377,876,221**
21 මුදල් සහ මුදල් සමාන		
ලංකා බැංකුව- ජංගම ගිණුම -1791	64,040,675	853,373
ලංකා බැංකුව - ජංගම ගිණුම -83302834	494,609	206,090
ලංකා බැංකුව - ජංගම ගිණුම -83867162	51,281	866,863
	64,586,566	**1,926,327**
සටහන - ලංකා බැංකුව- ජංගම ගිණුම -1791		
ලංකා බැංකුව- ජංගම ගිණුම -31.12.2022	(159,325)	-
ලංකා බැංකුව - ඕවරනයිට් ආයෝජනය - 31.12.2022	64,200,000	-
	64,040,675	
22 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම		
ජනවාරි 01 දිනට ශේෂය	**4,905,475**	**4,587,845**
පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොලී ආදායම	366,333	194,189
ලාභ හෝ අලාභවල හඳුනාගත් වියදම්	-	123,441
දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,271,808**	**4,905,475**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2022	2021
23 උපචිත සහ අනෙකුත් ගෙවීම්		
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - විශ්වවිද්‍යාල	494,332,300	50,715,900
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - කාර්මික විද්‍යාල	10,487,500	7,313,600
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - උසස් අධ්‍යාපන ආයතන	10,647,800	-
රඳවා ගැනීමේ ගිණුම	1,547,409	1,547,409
රඳවා ගැනීමේ ගිණුම ශාන්ත ආනා විද්‍යාලය	382,417	382,417
රඳවා තබා ගැනීම ගිණුම ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාල	243,503	243,502
රැඳවුම් ඇඹිලිපිටිය පිහිනුම් තටාකයේ වියදම්	585,449	585,449
ගෙවිය යුතු විගණන ගාස්තු	348,000	348,000
ගෙවිය යුතු වි.ප්‍ර.කො.ස. ප්‍රදාන	68,600	68,600
Slip Return - විශ්වවිද්‍යාල	2,492,903	2,260,450
Slip Return - කාර්මික විද්‍යාල	2,070,000	23,328
Slip Return - උසස් අධ්‍යාපන ආයතන	139,350	30,854
අතථ්‍ය රැස්වීම් පැවැත්වීම	-	27,430
දුරකථන බිල්පත	52,591	91,500
අතිකාල සඳහා ගෙවිය යුතු මුදල්	1,238	1,074,097
පැමිණීමේ දීමනාව සඳහා ගෙවිය යුතු මුදල්	130,000	111,250
වැටුප් සහ වැටුප් සඳහා ගෙවිය යුතු මුදල්	78,000	-
පාසල් සංවර්ධන කටයුතු	1,074,097	475,700
නිවාඩු මුදල් ගෙවීම සඳහා ගෙවිය යුතු මුදල්	411,081	-
ගෙවිය යුතු ශිෂ්‍යත්ව ගෙවීම	29,800	432,000
ගෙවිය යුතු භාරකාර ගාස්තු	235,897	-
ගෙවිය යුතු ගොඩනැගිලි කුලී	1,207,800	-
විදුලිය සහ ජලය	-	51,378
	526,578,821	**65,801,507**

24 ප්‍රාග්ධන හා අනෙකුත් බැඳීම්

2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ වෙනත් මූල්‍ය කැපවීම් කිසිවක් නොතිබුණි.

25 වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

දෙසැම්බර් 31 වාර්තාකරණ දිනය සහ බලය පැවැරූ දිනය අතර මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් හෝ අනාවරණ සිදුකිරීමට අවශ්‍ය වන්නා වූ සිදුවීම් නොතිබුණි.

26 අනිශ්චිත වගකීම්

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම්/හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය

ප්‍රමාණාත්මක අනිශ්චිත වගකීම් කිසිවක් නොතිබුණි.

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

27 සම්බන්ධිත පාර්ශව අනාවරණ

භාර අරමුදල ආශ්‍රිත පාර්ශවයන්ට අදාළ ආයතන සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇතුළත් වේ.

සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු

සාමාන්‍ය වාණිජ නියමයන් යටතේ 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ පහත ගනුදෙනු අදාළ පාර්ශ්ව සමඟ සිදු කර ඇත.

සමාගමේ / ආයතනයේ නම	සබඳතාවය	ගනුදෙනුවල ස්වභාවය	ගනුදෙනුවේ වටිනාකම	ලැබිය යුතු/ගෙවිය යුතු මුදල
සංවර්ධන ලොතරැයි මණ්ඩලය	සාමාන්‍ය අධ්‍යක්ෂ	ලාභ කොටස	1,381,768,390	266,790,550
නැටිවෙල්ත් සෙකියුරිටීස් සමාගම	සාමාන්‍ය අධ්‍යක්ෂ	NWSL වෙතින් ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(148,950)	-
	සාමාන්‍ය අධ්‍යක්ෂ	අරමුදල් හුවමාරු ගිවිසුම යටතේ NWSL වෙතින් MTF වෙත ලැබුණු අරමුදල්.	(850,000,000)	-
		ආයෝජනයෙන් ලැබෙන ආදායම	(126,500,344)	-
		භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය	593,798,500	
		NWSL වෙත අරමුදල් මාරු කිරීම	396,828,400	
		ස්ථාවර තැන්පතු වල ආයෝජනය	450,000,000	
		ස්ථාවර තැන්පතු කල්පිරීම	(450,000,000)	

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

28 මූල්‍ය සාධනපත්‍ර හා අවදානම් කළමනාකරණය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වාර්තාකර ඇති එක් එක් කාණ්ඩයේ මූල්‍ය සාධනපත්‍රවල ගිණුම්කරණ වර්ගිකරණය සහ ඒවායේ ධාරණ වටිනාකම පහත දක්වා ඇත.

මූල්‍ය වත්කම් හා බැරකම්වල ධාරණ වටිනාකම	Note	2022	2021
වෙනත් විස්තීරණ ආදායම හරහා සාධාරණ වටිනාකම මූල්‍ය වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර	**17**	**6,208,728,828**	**7,992,639,179**

FVTOCI ආයෝජන 2022 දෙසැම්බර් 31 දිනට සාධාරණ වටිනාකමට ප්‍රකාශ කොට ඇත

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම මූල්‍ය වත්කම්			
REPO	**17**	-	134,000,000
ලංකා බැංකුව - ස්වීපර ගිණුම -4079	**17**	1,328,206	1,328,206
		1,328,206	**135,328,206**

ක්ෂය කළ පිරිවැය			
භාණ්ඩාගාර බිල්පත්	**17**	5,336,408,950	-
ණයකර	**17**	375,000,000	1,075,000,000
ස්ථාවර තැන්පතු	**17**	500,000,000	3,760,000,000
අනෙකුත් ලැබිය යුතු දෑ	**20**	1,444,154,595	381,362,673
මුදල් හා මුදලට සමාන දෑ	**21**	64,586,566	1,926,327
		7,720,150,111	**5,218,289,000**

ආයතනික ණය ඵලදායි පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂිප්ත පිරිවැයක් යටතේ ප්‍රකාශ කර ඇති අතර, ක්‍රමක්ෂ කළ පිරිවැය යටතේ නම් කරන ලද අනෙකුත් මූල්‍ය වත්කම්වල ධාරණ අගය සාධාරණ වටිනාකමට ආසන්න වන බැවින් ධාරණ අගයෙන් ප්‍රකාශ කරනු ලැබේ.

මූල්‍ය බැරකම්

වෙනත් මූල්‍ය බැරකම්			
වෙනත් ගෙවිය යුතු දෑ	**23**	**518,226,378**	**60,788,277**

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් මූල්‍ය බැරකම් ක්‍රමක්ෂිත පිරිවැයට ප්‍රකාශ කර තිබේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට